

# ජාතික රක්ෂණ භාර අරමුදල
# වාර්ෂික වාර්තාව - 2009

# පටුන

පිටුව


දැක්ම හා මෙහෙවර 02

සමායතනික ඉලක්ක 03

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි (NITF) අධ්‍යක්ෂ මණ්ඩලය 05

සභාපතිවරයාගේ සමාලෝචනය 06

ජාතික රක්ෂණ භාර අරමුදල - සංක්ෂිප්තව 10

පාරසරික සමාලෝචනය 11

සමායතනික සමාජ වගකීම 13

සමායතනික පාලනය 15

අවදානම් කළමනාකරණය 18

විගණන වාර්තාව 21

ආදායම් ප්‍රකාශය 26

ශේෂ පත්‍රය 27

සමුච්චිත අරමුදලෙහි වෙනස්වීම් ප්‍රකාශය 28

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 29

ගිණුම්කරණ ප්‍රතිපත්ති 30

මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන් 34

මූල්‍ය සමාලෝචනය 39

අග්‍රහාර රක්ෂණය පිළිබඳ සමාලෝචනය 42

මෝටර් වාහන රක්ෂණය පිළිබඳ සමාලෝචනය 44

ප්‍රතිරක්ෂණය පිළිබඳ සමාලෝචනය 45

වැ.කැ.කෝ.සි.අ.හා තු. අරමුදල පිළිබඳ සමාලෝචනය 47

සාමාන්‍ය රක්ෂණය පිළිබඳ සමාලෝචනය 49

විදෙශ රැකියා රක්ෂණය පිළිබඳ සමාලෝචනය 52

සිව් වසරක සාරාංශය 54

සමායතනික තොරතුරු 56

## දැක්ම

ආරක්ෂාව අවැසි සියළු අංශයන්ට ආවරණය සහ ආරක්ෂණ ජාලයක්

## මෙහෙවර

- සමාජයෙහි අගහිඟකම්වලින් පෙළෙන සියලුම අංශයන් අරබයා දැරිය හැකි කාර්යක්ෂම හා ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම
- වෙනස්වෙමින් පවත්නා අවශ්‍යතාවන් තුළින් පැන නගින ඉහළ අවදානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශිකිරීම් හා වෙනත් වැඩපිළිවෙළවල් තුළින් දේශීය වෙළෙඳපළට විසඳුම් සලසාලීම
- දේශීය රක්ෂණ වෙළෙඳපළට අතිරේක ශක්මතාව සලසාලීම සහ ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපළක් නිර්මාණය කරලීම

තුළින් ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට සහභාගිවීම.

## සමායතනික ඉලක්ක

- සියළුම සමාජයීය කොටස් ආවරණය කෙරෙන අපේක්ෂිත ඉලක්කගත කණ්ඩායම්වල යහසාධනය අරබයා නව රක්ෂණ ක්‍රම සැලසුම් කොට ක්‍රියාවට නංවාලීම.

- ප්‍රතිරක්ෂණ වෙළෙඳපළෙහි යටත් පිරිසෙයින් 50% ක් ග්‍රහණය කරගනු පිණිස ප්‍රතිරක්ෂණ ක්‍රමයක් සැලසුම්කොට ක්‍රියාවට නංවාලීම.

- ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ක්‍රියාත්මක කෙරෙන සියලුම රක්ෂණ ක්‍රම ස්වයංකරණය කිරීම.

- සියලුම ප්‍රතිලාභීනට අතිශයින් කාර්යක්ෂම සේවාවක් සලසාලනු පිණිස මානව සම්පත් සංවර්ධනය කරලීම.

- ඉදිරි පස් වසරක කාලසීමාව තුළදී උපරිම ප්‍රතිලාභයක් අත්කරගත හැකිවන පරිදි ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ආයෝජන කළමනාකරණය කරලීම.

- රක්ෂණ ක්‍රමයන්ට සහභාගිවන්නන් දැනුවත් කරලීමේ වැඩසටහන් මාර්ගයෙන් ප්‍රවර්ධනය දිරිමත් කරලීම.

- ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ඉදිරි මෙහෙයුම් කටයුතු පහසු කරලීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සංවර්ධනය කරලීම.

- ජාතික රක්ෂණ භාර අරමුදලෙහි කාර්ය පාරිපාටි සවිමත් කරලීම.

- අවදානම් කළමනාකරණ ඒකකයක් පිහිටුවාලීම සහ ක්ෂේත්‍ර අධ්‍යයනයක් පැවැත්වීම සඳහා සිය ඉදිරි රක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව ජාතික රක්ෂණ භාර අරමුදලට මගපෙන්වීම.

- අනිවාර්යය ස්වභාවික ව්‍යසන රක්ෂණාවරණ යෝජනා ක්‍රමයක් සම්පාදනය කරලීම.

- යොවුන් පිරිස්හි සහභාගිත්වය දිරිගැන්මීම තුළින් ප්‍රවීණ රක්ෂණ කාර්යමණ්ඩලයෙහි ඉදිරියේදී වර්ධනය වන අවශ්‍යතාවන් සපුරාලනු පිණිස අධ්‍යාපන මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කරලීම.

# ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩලය

❖ **සේනක ඩී. අබේගුණසේකර මහතා - වත්මන් සභාපති**
*PGD. BBM (UK), MBA (USA), DIIR*

## 2009

| | |
|---|---|
| ❖ **ඒ.ඒ. විජේපාල මහතා** | **සභාපති** |
| ❖ උදය රංජිත් සෙනවිරත්න | මණ්ඩල සාමාජික |
| ❖ ඩබ්ලව්.එච්. පියදාස මහතා | මණ්ඩල සාමාජික |
| ❖ වෛද්‍ය නිහාල් ජයතිලක මහතා | මණ්ඩල සාමාජික |
| ❖ වෛද්‍ය ලෝහිත සමරවික්‍රම මහතා | මණ්ඩල සාමාජික |
| ❖ වෛද්‍ය පී.ඩබ්ලිව්. සී.පනාගොඩ මහතා | මණ්ඩල සාමාජික |
| ❖ කේ.ඒ.ඩී. හේමරත්න | මණ්ඩල සාමාජික |
| ❖ ලසිනි සේරසිංහ මහත්මිය | මණ්ඩල සාමාජික |
| ❖ ජේ. දඩල්ලගේ මහතා | මණ්ඩල සාමාජික |
| ❖ ආර්. සේමසිංහ මහතා | මණ්ඩල සාමාජික |

# සභාපතිවරයාගේ සමාලෝචනය



## 2009 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම

ජාතික රක්ෂණ භාර අරමදලෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2009 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා වන 2009 වාර්ෂික වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශයන් මා ඉදිරිපත් කරනුයේ අභිමානයෙන් යුත් හැඟීමෙනි.

## ආර්ථිකය

අතිගරු ජනාධිපතිතුමාගේ අභීත නායකත්වයත් ආරක්ෂක හමුදාවන්හි අප්‍රතිහත ප්‍රයත්නයත් නිසාවෙන්, පුරා තිස් වසරක් පැවති යුද්ධය බෙහෙවින් සහනයක් ගෙන දෙමින් නිමාවට පත්වුවද, ඉහළ යුද වියදම,ගෝලීය ආර්ථික අර්බුදය මෙන්ම ශ්‍රී ලාංකේය මූල්‍ය අර්බුදය හේතුවෙන් ශ්‍රී ලාංකේය ආර්ථිකය පසුබෑමකට ලක් වී ඇත. 2009 වර්ෂයේදී වත්මන් වෙළෙඳපළ මිල ප්‍රමාණය මත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 4,825 ක් වූ අතර වත්මන් වෙළඳපළ මිල ප්‍රමාණය මත දළ ජාතක නිෂ්පාදිතය රුපියල් බිලියන 4,769 ක් විණි. දළ ජාතික නිෂ්පාදිතයෙහි වර්ධන අනුපාතිකය 4.8% ක් ද දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධන අනුපාතිකය 3.5% ක් ද විණි. එහෙත්, ශ්‍රී ලංකාව තුළ සාමය උදාවත් සමඟ 2009 වර්ෂයේ පශ්චාත් භාගය තුළදී ශ්‍රී ලාංකේය ආර්ථිකයෙහි පසුබෑම් තතත්වය යළි ප්‍රකෘති ස්වභාවය කරා එළඹීමේ තත්ත්වයක් බවට පරිවර්තනය වී තිබේ.

**සදෘෂ්‍යභාවය**

සිය මූලික අග්‍රහාර රක්ෂණ ක්‍රමයත් සමග 2006 අංක 28 දරන ජාතක රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාර 2006 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටු වාලීමෙන් අනතුරුව සමාජ සුබසාධනය දෙසට නැඹුරුවක් පෙන්නුම්කරලමින් එය සිය රක්ෂණ ව්‍යාපාරික පරාසය අනවරතයෙන් ප්‍රසාරණයට ලක් කර ඇත. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් අන්තර් ග්‍රහණය කරනු ලැබුවාවූ දැනට පවත්නා අග්‍රහාර රක්ෂණ ක්‍රමය මෙන්ම වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල දීර්ඝ කිරීමට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රක්ෂණ ක්‍රමය,මෝටර් වාහන රක්ෂණ ක්‍රමය, විදේශ රැකියා රක්ෂණ ක්‍රමය, මෙන්ම 20% ක වැඩසටහන ක්‍රියාත්මක කරලමින් 2008 වසර අවසන් වනවිටදී ජාතික රක්ෂණ භාර අරමුදල සිය රක්ෂණ විෂය සීමාව පුලුල් කර ඇත. මෝටර් වාහන රක්ෂණ ක්‍රමය පෞද්ගලික අංශය ආවරණය වන පරිදි දීර්ඝ කිරීමෙන් ද ගිනි උවදුරු,මුහුදු උවදුරු සහ විවිධ රක්ෂණය වැනි පොදු රකෂණ ව්‍යාපාරයන්ට අවතීර්ණවීමෙන් ද 2009 වර්ෂයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සිය ව්‍යාපාරික විෂයය පථය තවදුරටත් පුලුල් කරගනු ලැබ තිබේ.

**දැයට හා රක්ෂණ කර්මාන්තයට ජාතික රක්ෂණ භාර අරමුදලේ දායකත්වය**

2009 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ආරක්ෂක හමුදාවන්ට මිලියන 2.5 ක මුදලක් පරිත්‍යාග කරනු ලැබ ඇත. තවද, හමුදාවන් විසින් දමිළ සිවිල් වැසියන් මුදාගනු ලැබුවායින් පසුව ජාතික රක්ෂණ භාර අරමුදලෙන් මැණික් ෆාම් කඳවුරට ආහාර පාන ආදිය පරිත්‍යාග කර ඇත.

රජයේ ආර්ථික බරපැන ලිහිල් කරලනු පිණිස ජාතික රක්ෂණ භාර අරමුදලෙන් 2009 වසරේදී ජාතික අයවැයට රුපියල් බිලියන 2.25 පරිත්‍යාගයක් කරන ලදී.

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශය සඳහා බෙහෙවින් අනුග්‍රහාත්මක පිරිමැසුම් ගාස්තු මත අග්‍රහාර හා මෝටර් වාහන රක්ෂණ ක්‍රම ක්‍රියාවට නංවාලීම තුළින් ජාතික රක්ෂණ භාර අරමුදල රජයේ මූල්‍ය සම්පත් සංරක්ෂණය කරලීමට සමත් වී ඇත. 20% ක වැඩසටහන ක්‍රියාත්මක කරලීමෙන් විදේශීය විනිමය බැහැර යාම සැලකිය යුතු පමණින් වලක්වාලීමට ජාතික රක්ෂණ භාර අරමුදලට හැකි වීමෙන් ජාතික ආර්ථික වර්ධනය කෙරෙහි වාසිදායක බලපෑමක් සිදුව□ ඇත.

තවද, විදේශීය ප්‍රතිරක්ෂණ කරුවනට සාපේක්ෂ වශයෙන් දේශීය රක්ෂණකරුවන් වෙත ආර්ථිකමය වශයෙන් ප්‍රතිරක්ෂණ සේවා සලසාලීමේ එකම දේශීය ප්‍රතිරක්ෂණකරු බවට ජාතික රක්ෂණ භාර අරමුදල පත්වී තිබේ. වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල තිරසාර පදනමක් මත පිහිටුවාලීම තුළින් පොදු රක්ෂණ සමාගම් සමග සහයෝගීත්වයෙන් වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද තුළින් පැන නගින සමාජ ව්‍යසන වෙනුවෙන් ආර්ථිකමය ලෙස ආවරණ සලසාලීමට ජාතික රක්ෂණ භාර අරමුදල සමත් වී ඇත.

ස්වාභාවික ව්‍යසනවලින් රට ආරක්ෂා කරලීම උදෙසා ආපදා අරමුදල පිහිටුවාලීමත්, වැවිලි භෝග හා පශු සම්පත් රක්ෂණය නංවාලනු පිණිස වැවිලි භෝග රක්ෂණය සහ පශු සම්පත් රක්ෂණය කරා විවිධාංගීකරණයවීම මෙන්ම අපනයන ණය රක්ෂණය කරා විවිධාංගීකරණයවීමත් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි මූලෝපායික අභිප්‍රාය වන්නේය. අන්තර්ග්‍රහණ තුළින් ව්‍යාප්ත වීමේ අරමුණ ද ජාතික රක්ෂණ භාර අරමුදලට ඇත.

## මූල්‍ය කාර්ය සාධනය

2008 වර්ෂයේ දී රුපියල් බිලියන 3,427 ක් වූ ඉපයූ වාර්ෂික ආදායම හා සසඳන කල්හි 2009 වර්ෂයේ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ඉපයූ දළ වාරික ආදායම රුපියල් බිලියන 4,019 ක. මෙය 17.26% වර්ධනයකි. 2008 වර්ෂයේ දළ ශුද්ධ ආදායම වූ රුපියල් මිලියන 2,862 ක හා සසඳන කල්හි 2009 වර්ෂයේ දළ ශුද්ධ ආදායම රුපියල් මිලියන 3,202 ක. මෙය 11.88% ක වර්ධනයකි. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි මූල්‍ය කාර්ය සාධනය මූල්‍ය සමාලෝචන අංශය යටතේ විස්තරාත්මකව උක්වා තිබේ.

## ඇගයීම

විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමාණන්, මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමන්, භාණ්ඩාගාර ලේකම්තුමන්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ඇතුළුව අපගේ රක්ෂණ සහතිකදරන්නන්ට, හිමිකම් පාන්නන්හට, රක්ෂණ තැරැව්කරුවන්හට ප්‍රතිරක්ෂකයින්හට, ප්‍රතිරක්ෂණ තැරැව් කරුවනට, තක්සේරුකරුවනට, පාඩු ගැළපුම් කරුවනට, මැදිහත්කරුවනට, සේවාදායකයින්ට, ජාතික රක්ෂණ භාර අරමුදලේ හිටපු සභාපතිවරුනට,වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලෙහි තාක්ෂණ කමිටු සහ ක්‍රියාකාරී කමිටු රැස්වීම්වලට සහභාගි වූ රක්ෂණ සමාගම්වල තාක්ෂණික උපදේශක කමිටුවල හා ක්‍රියාකාරී කමිටුවල සාමාජිකයිනට, ජාතික රක්ෂණ භාර අරමුදලේ, වැඩවර්ජන කැරළි කෝලාහල,

සිවිල් අරගල හා ත්‍රස්තවාද සහ ප්‍රතිරක්ෂණ මෙහෙයුම්වලදී අන්‍යෝන්‍යව ක්‍රියාකාරීවූ රක්ෂණ සමාගම්වල අනෙකුත් නිලධරයන්ට අප කෙරෙහි විශ්වාසය තැබූ හා වගකීම් පැවරූ මෙන්ම සාර්ථක කාර්ය සාධනයකින් සපිරි වසරක් උදාකරලීමට දායක වූ අනෙකුත් සියලුම පාර්ශවකරුවනටත් මම මේ අවස්ථාවේදී කෘතඥතාපූර්වක ස්තුතිය පුද කරමි.

*අත්/කළේ:*

**සේනක ඩී. අබේගුණසේකර**
*PGD. BBM(UK), MBA(USA), DIIR*
සභාපති
ජාතික රක්ෂණ භාර අරමුදල

# ජාතික රක්ෂණ භාර අරමුදල සංක්ෂිප්තව

බලාපොරොත්තු නොවූ සෞඛ්‍ය අවදානම්, පුද්ගල අනතුරු හා දේපළ හානි වෙනුවෙන් සහනදායක රක්ෂණ යෝජනා ක්‍රම මගින් ප්‍රතිලාභ හා ආරක්ෂණ සලසාලනු පිණිස 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමදල පනත යටතේ 2006 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටුවන ලදී. ප්‍රතිලාභ සැලසීමේදී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රක්ෂණ යෝජනා ක්‍රමය, මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රමය, විදේශ රැකියා රක්ෂණ යෝජනා ක්‍රමය හා 20% ක ප්‍රතිරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල අන්තර්ග්‍රහණය කරගන්නා ලදී.

මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් පත්කරගනු ලැබූ සාමාජිකයින් අට දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් ජාතික රක්ෂණ භාර අරමුදල කළමනාකරණය කරනු ලබන අතර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය නියෝජනය කෙරෙන, සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කෙරෙන, නිලධරීගෙන් සහ විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් නම් කරනු ලබන නිලධරීගෙන් මෙම මණ්ඩලය සංයුක්ත වනු ඇත.

මෙම මණ්ඩලයෙහි එක් තැනැත්තෙකු සභාපතිවරයා වශයෙන් පත්කිරීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය. පනත ප්‍රකාරව මණ්ඩලයෙහි සියලුම සාමාජිකයෝ පත්කරනු ලැබූ දින සිට පස් වසරක කාල සීමාවක් ධූරය දැරිය යුත්තාහ.

ජාතික රක්ෂණ භාර අරමුදලේ පරිපාලනමය වගකීම සභාපතිවරයා/ප්‍රධාන විධායක නිලධාරී වෙත පැවරී ඇති අතර තත් කාර්යයෙහිලා ඔහුට කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන් විසින් සහය දෙනු ලැබේ.

# පාරිසරික සමාලෝචනය

2008 වර්ෂයේ රුපියල් මිලියන 34,553 ක් වූ දළ ලිඛිත වාරිකය හා සසඳන කල්හි 2009 වර්ෂයේදී රුපියල් මිලියන 33,483 ක දළ ලිඛිත වාරිකයකුත් සමග 3.1% ක ඍණාත්මක වර්ධන අනුපාතිකයක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පෙන්නුම් කර ඇත. රක්ෂණ කර්මාන්තය තුළ පවත්නා අතිතියුණු තරඟකාරිත්වයෙන් පැන නැගුණු මිල යුද්ධයත් ගෝලීය හා මූල්‍ය ආයතනයන්හි කඩාවැටීම සමග ගෝලීය මූල්‍ය අවධමනය හේතුවෙන් දළ ලිඛිත වාරිකයෙහි ඍණාත්මක වර්ධන අනුපාතිකය වැඩිවීමත් මීට හේතුසාධක වූ බොහෝ කරුණු අතර විය. දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සමස්ත දළ ලිඛිත වාරිකය 2009 වර්ෂයේදී රුපියල් මිලියන 57,252 ක අගයක් වාර්තාගත කර ඇත. මෙය රුපියල් මිලියන 58,166 ක් වූ දළ ලිඛිත වාරිකයෙහි 2008 වර්ෂයේ අගයෙන් 1.57 % ක පහත බැසීමකි. මෙම දශකයෙහි අවසාන භාගය හා සසඳන කල්හි 2009 වර්ෂය තුළ වාරික ආදායමෙහි වර්ධනය පහත බැසීම දළ දේශීය නිෂ්පාදිතයට 1.195% ක අඩු දායකත්වයක් සැපයීමකි.

දළ ලිඛිත වාරිකය සුළු ප්‍රමාණයක අඩුවීමක් පෙන්නුම් කර ඇතත් 2009 වර්ෂය අවසන්හිදී රක්ෂණ සමාගම්වල සමස්ත හිමිකාර අරමුදල ඊට කළින් වර්ෂයේ රුපියල් මිලියන 25,055 ක අගය හා සැසඳීමේදී 15.96% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2009 දෙසැම්බර් මස 31 වැනි දිනට සියලුම රක්ෂණ සමාගම්වල සමස්ත වත්කම් රුපියල් මිලියන 181,045 ක් විණි. මෙය 2008 වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 155,994 ක් වූ සමස්ත වත්කම් ප්‍රමාණය හා සැසඳීමේදී 16.06% ක වැඩිවීමකි. 2009 වර්ෂයේ අවසානයේදී ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය රක්ෂණ කටයුතුවල නියැලුණු රක්ෂණ සමාගම් 15 ක් වූ අතර ඒවායින් බොහෝමයක් පෞද්ගලික අංශයට අයත් විණි. එහෙත්, 2010 වර්ෂය තුළ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (IBSL) යටතේ ලේඛනගත රක්ෂණ සමාගම් සංඛ්‍යාව 19 ක් විණි.

2009 වර්ෂයේදී රාජ්‍ය අංශයට සම්බන්ධ රක්ෂණ සමාගම් මතුවී ඒම තුළින් ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් කෙරෙහි මූලෝපායික වශයෙන් බලපෑමක් සිදුවිණි. රාජ්‍ය අංශයට සම්බන්ධ රක්ෂණ සමාගම් වනුයේ ජාතික රක්ෂණ භාර අරමුදල,මර්චන්ට් බැංකුවට අයත් සීමාසහත MBSL රක්ෂණ සමාගම සහ රාජ්‍ය අංශයට ආපසු පවරා දෙනු ලැබූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවයි. මහජන බැංකුවේ හිමිකාරත්වය යටතේ පවත්නා පීපල්ස් ලීසිං සමාගමට අයත් සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම ද 2009 වර්ෂයේ අගදී සංස්ථාගත කරනු ලැබිණි. සුනාමි ව්‍යසනය හේතුකොටගෙන 2009 වර්ෂයේදි ඇතිවූ පසුබෑමෙන් මිදී රක්ෂණ කර්මාන්තය ප්‍රකෘති තත්ත්වයට පත්වෙමින් ඇති බැව් ඉකුත් සිව් වසර තුළදී රක්ෂණ කර්මාන්තය පෙන්නුම් කර ඇත. වත්මන්හ රක්ෂණ කර්මාන්තය තුළ බොහෝ සංවර්ධනයන් සහ නියාමන වෙනස්කම් සිදුවෙමින් පවතී. එබඳු එක් වෙනස්කමක් වනුයේ ජාතික රක්ෂණ භාර අරමුදල පනතට යෝජිත සංශෝධනයන්ය. සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය තුළ පුළුල් පරාසයක ව්‍යාපාරික කටයුතුවල නියැළීමටත් රාජ්‍ය අංශයෙන් පෞද්ගලික අංශය තෙක් සිය මෙහෙයුම් විෂයය පථය පුළුල් කර ගැනීමටත් එකී සංශෝධනයන් තුළින් ජාතික රක්ෂණ භාර අරමුදලට පහසුකම් සැලසෙනු ඇත.

# සමායතනික සමාජ වගකීම

කොටස් හිමිකාර හා පාර්ශවකාර අපේක්ෂාවන් කෙරෙහි සැලකිලිමත්වන අතරම අනිවාර්යය වූ ආර්ථික පාරිසරික හා සමාජ අවශ්‍යතාවන් තුලනයක් හෝ ඒකාබද්ධතාවක් ඇතිකර ගැනිමෙන් සමායතනික සමාජ වගකීම් සපුරාලීම තුළින් ඉතා විශ්වසනීය සමායතනික පුරවැසියා යන සිය සමායතනික ප්‍රතිරූපය නංවාලීමට ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රයත්න දරයි.

රජයේ ආර්ථික බරපැන අවම කරලනු පිණිස ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2009 වර්ෂයේදී ජාතික අයවැයට රුපියල් බිලියන 2.25 ක පරිත්‍යාගයක් කරන ලදී.



තවදුරටත් 2009 වර්ෂයේදී වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල සම්බන්ධ අනුපාතක තීරණය කිරීමේ ක්‍රියාවලියේදී දේශප්‍රේමී ශ්‍රී ලංකා හමුදාවනට සලසනු ලබන පෞද්ගලික හදිසි අනතුරු ආවරණ වෙනුවෙන් ඉතා සහනදායී අනුපාතකයන් පනවනු ලැබ ඇත. 2009 වර්ෂයේදී වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල මගින් එල්ටීටීඊ ත්‍රස්ත ක්‍රියාවන් ගෙන් සිදුවන අනතුරුවලින් තුවාල ලැබූ හෝ මියගිය තැනැත්තන් වෙනුවෙන් සැලකිය යුතු ප්‍රමාණයක හිමිකම්පෑම් ගෙවන ලදී. ආරක්ෂ හමුදාවන්හි අප්‍රතිහත ප්‍රයත්නයටත් අතිගරු ජනාධිපතිතුමන්ගේ අභීත නායකත්වයටත් උපහාර දැක්වීමක් ලෙස රුපියල් මිලියන 2.5 ක මුදල් පරිත්‍යාග කිරීමෙන් එල්ටීටීඊ යුද්ධය නිමාකරලනු පිණිස රජයට අතහිතදීමට අරමුදලට හැකිවිණි.

එල්ටීටීඊ යුද්ධයට මුහුණ දෙමින් සටන් වැදුණ හමුදාවන්හි තුවාල ලැබූවන්ට සහන සලසාලම සඳහාත් ජාතික රක්ෂණ භාර අරමුදල එක්දිනක වැටුප් පරිත්‍යාග කර ඇත.

හමුදාවන් විසින් දමිළ සිවිල් වැසියන් මුදාගනු ලැබුවායින් අනතුරුව ජාතික රක්ෂණ භාර අරමුදල ආහාරපාන ද මැණික්ෆාම් කඳවුරට පරිත්‍යාග වශයෙන් ලබාදී තිබේ.



ජාතික රක්ෂණ භාර අරමුදල ඉහළ සහනදායී වාරික සමග අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය, හා "විදේශ රැකියා" යනුවෙන් හැඳින්වෙන එතෙර සේවා නියුක්ති රක්ෂණ යෝජනා ක්‍රමය වැනි සමාජ සුබසාධනය කෙරෙහි නැඹුරු වූ රක්ෂණ යෝජනා ක්‍රම ගණනාවක්ම ක්‍රියාත්මක කර ඇත.

# සමායතනික පාලනය

## හැඳින්වීම

නිසි අවදානම් කළමනාකරණය, සංවිධානය සතු සම්පත් වගකීමෙන් පරිහරණය කිරීම තුළින අරමුණු මුදුන්පත් කර ගැනීම සහතික කර ගනිමින් උපාය මාර්ගික මෙහෙයුම් ඉලක්කය පෙරදැරිව අධ්‍යක්ෂ මණ්ඩලය හා විධායක කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කෙරෙන වගකීම් රැස හා භාවිතයන්, ව්‍යවසාය පාලනය යන්නෙන් හැඳින්වෙයි.

ව්‍යවසාය පාලනය, සංවිධානයෙහි මුළු වගවීමේ (Accountability) ආකෘතික රාමුවෙන් සංයුක්ත වෙයි. සමතුලිතව පවත්වා ගත යුතු වන්නාවූ අනුකූලනය වීම හා කාර්යසාධනය යනුවෙන් ව්‍යවසාය පාලනයෙහි මානයන් දෙකකි.

අනුකූලනය වීම යන්නට සමායතනික පාලනය යන්නෙන් වහරනු ලැබේ. එමගින් මණ්ඩලීය ව්‍යුහයන්, භූමිකාවන් හා විධායක පාරිශ්‍රමිකය වැනි ප්‍රසාදක ආවරණය කෙරේ. නොයෙකුත් සමායතනික පාලන අපචාර හේතුකොටගෙන මෑත වර්ෂයන්හි ඊට සැලකිය යුතු ආවරණීයත්වයක් ලැබී තිබිණි. මෙම ක්ෂේත්‍රයෙහි ලා ඉදිරියේදී තවදුරටත් සංවර්ධනීය තත්ත්වයක් හටගනු ඇත. රෙගුලාසි සංග්‍රහයන් සහ/හෝ ප්‍රමිතීන් පැනවීමෙන් සහ ඒවාට අනුකූලව ක්‍රියාකිරීම තහවුරු කර ගැනීම/ විගණනය කර ගැනම මාර්ගයෙන් මෙම තත්ත්වයට සාමාන්‍යයෙන් විසඳුම් සෙවිය හැකිය. සමායතනික යහපාලන ක්‍රියාවලින් - උදා: විගණන කමිටු-සඵලව ක්‍රියාත්මක වන බව සහතික කරගනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිතයට ගතහැකි මනාව ස්ථාපිත සුපිරික්සුම් යන්ත්‍රනයක් ද තිබේ.

මනාව පාලනය වන පරිසරයක සාර්ථකත්වයේ තීරණාත්මක සාධකය ලෙසින් ප්‍රබල සමායතනික පාලනයෙහි වැදගත් බව ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ඉහළම උපාය මාර්ගික තලයෙන් පිළිගනු ලැබ ඇත. එවැන්නකින් අවසානයෙහිදී මෙහෙයුම් සඵලතාව, කාර්යක්ෂමතාව හා සකසුරුවම්බව නංවාලමින් විනය, විනිවිදභාවය, ස්වාධීනත්වය, වගවීම, වගකීම, සාධාරණත්වය හා සමාජ වගකීම යන උත්කෘෂ්ට සමායතනික පාලන අගයන් ක්‍රියාත් මක කරන අතරම සන්නන් ප්‍රතිරූපය ඉහළ නංවමින් මහජන විශ්වාසය පවත්වාගනු ඇත.

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත යටතේ 2006 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටවනු ලැබූ තැන් සිට එහි සමායතනික පාලන භාවිතයන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කෙරුණු ප්‍රශස්ත භාවිතයන් පිළිබඳ සමායතනික පාලන සංග්‍රහයේ සහ යහපාලනය සඳහා වූ පොදු ව්‍යවසාය මාර්ගෝපදේශන්හි අදාළ ක්ෂේත්‍රයන්ට නිසි සැලකිල්ලක් දක්වමිනි.

## මූල්‍ය නිපුණතාව

2009 වර්ෂය තුළදී කළමනාකරණ මණ්ඩලයේ මූල්‍ය නිපුණතාව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා සහ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා විසින් මනාව සවිමත් කෙරිණි.

## රක්ෂණ නිපුණතාව

2009 වර්ෂය තුළදි කළමනාකරණ මණ්ඩලයෙහි රක්ෂණ නිපුණතාව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින මනාව සවිමත් කෙරිණි.

## කළමනාකරණ මණ්ඩලය

ජාතික රක්ෂණ භාර අරමුදල කළමනාකරණය කරනුයේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 8 දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් මගිනි. එකී කළමනාකරණ මණ්ඩලයට මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියෝජිතයෙක්. ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ මූල්‍ය, බැංකු, රක්ෂණ කළමනාකරණ හා නීතිය යන ක්ෂේත්‍රයන්හි විද්වතුන් නියෝජනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන වෙනත් තැනැත්තන් තිදෙනෙක් අයත් වෙති. එක් නයෝජිතයෙකු සභාපතිවරයා වශයෙන් පත් කිරීමට අමාත්‍යවරයාට බලය පැවරී ඇත්තේය. මතු දැක්වෙන පරිදි පත්කරනු ලැබූ දින සිට මණ්ඩලයෙහි සියලුම සාමාජිකයෝ අවුරුදු 05 ක කාලයක් සඳහා ධූර දැරිය යුත්තාහ. අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සාමාජිකයින්ගේ නම්, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩලය යනුවෙන් සඳහන් කොට ඇති පිටුවෙහි දැක්වේ.

## අභ්‍යන්තර පාලනය

2009 වර්ෂය තුළදී කාර්යාංශයන්හි අභ්‍යන්තර විගණන සහ වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල ඇතුළුව අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කරනු ලැබ ඇත්තේ අභ්‍යන්තර විගණන කාර්යාංශය විසිනි.

## විගණන කමිටුව

2009 වර්ෂය තුළදී විගණන කමිටුව පිහිටුවනු ලැබූ අතර එහි විෂයය පථය පහත දක්වා ඇති පරිදි වේ:-

1. අභ්‍යන්තර විගණන ඒකකයෙහි වගකීම් නිශ්චය කරලීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය.
2. ආයතනයෙහි සියලුම ක්‍රියාකාරකම්, අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය සහ ඇගයීම.
3. පිරිවැය ඵලදායිතාව සඳහා කාර්ය සාධනය නිතිපතා සමාලෝචනය සහ අපතේ යන වියදම් ආදිය දුරලීම.
4. බාහිර විගණක සමග සමායෝජනය හා විගණකාධිපතිවරයාගේ බාහිර කළමනාකරණ ලිපිවල සඳහන් උපදෙස් අනුගමනය කිරීම.
5. අණපනත්, නීතිරීති සහ චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියාකරනු ලබන බැව් නිශ්චිත වශයෙන් සොයා දැන ගැනීම.
6. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකිරීම සහතික කරගනු පිණිස මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය.
7. ප්‍රතිකර්ම වශයෙන් පියවර ගැනීම සහතික කරගනු පිණිස අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සමාලෝචනය.
8. පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.


9. වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් කරනු පිණිස කාරක සභාවේ නිගමනයන් පිළිබඳ වාර්තා පිළියෙළ කිරීම.

**තොරතුරු සැපයීම**

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කාර්ය සාධනය පිළිබඳ මාසික වාර්තා සහ කලින් පැවති මණ්ඩලයීය රැස්වීම්වල කාර්ය සටහන් සහ ලේඛන, මණ්ඩලීය රැස්වීම් පැවැත්වීමට සතියකට පෙරාතුව දැනගැනීම සඳහා බෙදාහරිනු ලැබේ.

උපාය මාර්ගික තීරණයන්ට එළඹෙනු පිණිස සභාපතිවරයා ඇතුලු මණ්ඩලය මාසිකව රැස් වන්නීය. 2008 වර්ෂය තුළදී මණ්ඩලය දස වතාවක් රැස්වී ඇත.

# අවදානම් කළමනාකරණය




### හැඳින්වීම

අවදානම් කළමනාකරණය යනු ජාතික රක්ෂණ භාර අරමුදලෙහි මූලෝපායික කළමනාකරණයෙහි කේන්ද්‍රීය අංශයකි. එක් එක් ක්‍රියාකාරකමකින් හෝ සියලුම ක්‍රියාකාරකම් ගොන්න හරහා තිරසාර ප්‍රතිලාභ නෙළාගැනීම ඉලක්කකොට, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළින් සිය ක්‍රියාකාරකම්වලට බද්ධව පවත්නා අවදානම් කෙරෙහි ක්‍රමිකව සැලකිල්ල යොමු කෙරේ. මෙකී අවදානම් හඳුනාගනිමින්, ඒවාට ප්‍රතිකර්ම වශයෙන් පියවර ගැනීම කෙරෙහි ප්‍රශස්ත අවදානම් කළමනාකරණය මූලික වශයෙන්ම අවධානය යොමුවියයුතු බැව් ජාතික රක්ෂණ භාර අරමුදල පිළිගෙන ඇත. ජාතික රක්ෂණභාර අරමුදලෙහි අරමුණවනුයේ සංවිධායට බලපෑ හැකි සියලුම සාධක ඇසුරින් ඇති විය හැකි වාසි හා අවාසි වටහාගැනීම තුළින් සංවිධානයෙහි සියලුම ක්‍රියාකාරකම්වලට උපරිමයෙන් තිරසාර අගයක් එක් කරලීමය.ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අභ්‍යන්තර හා පාරිසරික විශ්ලේෂණය, අරමුණු තීරණය කිරීම, සිදුවීම් හඳුනාගැනීම, අවදානම්වලට අදාළව තක්සේරුව, ක්‍රියාපිළිවෙත් තෝරාගැනීම, පාලන කටයුතු ස්ථාපිත කරලීම හා ක්‍රියාත්මක කරලීම, තොරතුරු හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම, සන්නිවේදනය, පසුවිපරම් කිරීම සහ ඇගැයීම ආදී ව්‍යවසාය අවදානම කළමනාකරණ නව උපාය මාර්ග භාවිතා කරනු ලැබ ඇත. ව්‍යවසාය අවදානම් කළමනාකරණ උපාය මාර්ග භාවිතයට ගැනීමේදී මතු දැක්වෙන ප්‍රමුඛ අවදානම් හඳුනා ගැනීම තුළින් බලපෑම්/ප්‍රතිඵල ප්‍රමාණය සිදුවීමට ඇති ඉඩකඩ ඇගයීමට ලක්කරනු ලැබ ඇත. ඒ අනුව වළක්වාලීම, ප්‍රතිග්‍රහණය, පැවරීම, හවුලේ භාවිතය, ඉවත් කරලීම සහ කළමනාකරණය ආදී අවදානම් ප්‍රතික්‍රියා උපාය මාර්ග යොදාගනු ලැබ ඇත.

### අවදානම් කළමනාකරණයෙහි වගකීම

ස්වකීය වගකීම්වල කොටසක් වශයෙන් අවදානම් කළමනාකරණ උපාය මාර්ගය නිශ්චය කරලීමේ වගකීම මණ්ඩලයට හා විගණන කමිටුවට පැවරී ඇත. අවදානම සහ අභ්‍යන්තර පාලනය පසුවිපරම් කරලීම සහ සංවිධානයෙහි උපායමාර්ගය පිළිබඳව සේවානියුක්තයින් දැනුවත් කරලීම සම්බන්ධ වගකීම ද ඔවුනට පැවරේ.

### R01 - උපාය මාර්ගික අවදානම

උපාය මාර්ගික අරමුණු මුදුන්පත් කර ගැනීම සහතික කරගනු පිණිස ජාතික රක්ෂණ භාර අරමුදලෙහි උපාය මාර්ගික අභිප්‍රාය කෙරෙහි බලපෑ හැකි ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශයට සම්බනධ දේශපාලන, තාක්ෂණික, සමාජ-සංස්කෘතික/

ආර්ථික සංවර්ධනයන් රක්ෂණ ක්ෂේත්‍රයෙහි තරඟකාර-ගනුදෙනුකාර ගතික ස්වභාවයන ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සෝදිසියෙන් පසුවිපරම් කරනු ලබමින් ඇත.

### R02 - අන්තර් ජාතික අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ව්‍යාපාරික කටයුතු කෙරෙහ සෘජු බලපෑමක් ඇති අන්තර්ජාතික දේශපාලන හා සමාජ/ආර්ථික ගතිකභාවයන් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අධීක්ෂණය කරනු ලැබ ඇත. ශ ලාංකේය සාංක්‍රමණික සේවකයින් බහුතරයක් වෙසෙන මැදපෙරදිග රටවල්හි නැඹුරුතාවන් මෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ අංශය ආශ්‍රිත අන්තර්ජාතික ව්‍යාපාරික නැඹුරුතාවන් විශේෂයෙන් පසුවිපරම් කරලීම ඊට ඇතුලත් වූවකි.

### R03 - ප්‍රාරක්ෂණ අවදානම

ව්‍යසනකාරී සිද්ධීන් ඇතිවිය හැකිවීම හේතු කොටගෙන හිමිකම්පෑමේ වියදම් ඉහළ යෑමේ බරපැන අඩුකරලීම සඳහා 2009 වර්ෂයේදී සාමාන්‍ය රක්ෂණය,මෝටර් වාහන රක්ෂණය සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි 20% වැඩසටහන සඳහා පළමුපෙලේ ගෝලීය රක්ෂණ තැරැව්කරුවන් වන AON Benfield Re ආයතනය සමග ද, වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල සඳහා Willis Re ආයතනය සමග ද ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට එළඹ ඇත. BBB ඉහළ ණය ප්‍රමාණකරණයන් හිමි ප්‍රතිරක්ෂණ කරුවන් (එනම්, Fitch Credit Rating, Moody's Credit Rating, AM Best Credit Rating and Standard & Poor Credit Rating)

### R04 - ව්‍යාපාර අවදානම

වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද රක්ෂණය, මෝටර් වාහන රක්ෂණය, අග්‍රහාර රක්ෂණය, විදේශ රැකියා රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය ආදී වශයෙන් බොහෝ උපායමාර්ග ව්‍යාපාර ඒකකයන්ට විවිධාංගීකරණය කිරීම තුළින් ව්‍යාපාර අවාදනම අවම කරගනු ලැබ ඇත.

### R05 - විදේශ විනිමය අවදානම

විදේශ විනිමය ගනුදෙනු අවදානම ඉවත්කරලනු පිණිස ප්‍රතිරක්ෂණ වාර්ෂික ගෙවීම සඳහා දේශීය ව්‍යාපාරය මුදල් අගයන්ගෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට එළඹී ඇත.

### R06 - තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ අවදානම් මැඩලීමට ප්‍රතිකර්ම වශයෙන් විවිධ ක්‍රියාමාර්ගද ගනු ලැබ ඇත. වෛරස ආක්‍රමණ වළක්වාලනු පිණිස ජාතික රක්ෂණ භාර අරමුදල් කාර්යාලයෙ පරිගණකයන්හි Sophos Anti-virus පැකේජය ස්ථාපනය කර ඇත. පද්ධති අක්‍රියවීමෙන් පැනනගින අලාභ Backup Storage Systems සහ අඛණ්ඩ බල පද්ධති හරහා අවම කරගනු ලැබ ඇත.

### R07 - ආයෝජන ණය අවදානම

ආයෝජන ණය අවදානම අවම මට්ටමකට ලිහින්කරලනු පිණිස භාණ්ඩාගාර බිල්පත්, REPOs සහ භාණ්ඩාගාර බැඳුම්කරයන්හි අවදානම් මුක්ත ආයෝජන කරනු ලබනයේ රාජ්‍ය බැංකුවල පමණකි.

### R08 - මෙහෙයුම් අවදානම

මෙහෙයුම් පරිගණක ගතකිරීම තුළින් මෙහෙයුම් අවදානම අවම කරගනු ලැබේ. වාරික එකතු කරගැනීම් සහ හිමිකම්පෑම් ගෙවීම් සම්බන්ධයෙන් ඇතිවන දෝෂයන් හා විෂමතා අවම කරලනු පිණිස වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලෙහි සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අනිකුත් කාර්යාංශයන්හි අභ්‍යන්තර විගණන කටයුතු අභ්‍යන්තර විගණන කාර්යාංශය විසින් ඉටුකරනු ලැබ ඇත. තවද, දෝෂ සහ විෂමතා අවමර කරලනු පිණිස කාර්යාලයීය මෙහෙයුම් කටයුතු පරිගණකගත කරනු ලැබ තිබේ.

### R09 - සංකේන්ද්‍රන අවදානම

මහජන බැංකුව, ලංකා බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වැනි බොහෝ බැංකුවලට අයෝජනයන් විවිධාංගකරණය කිරීම තුළින් සංකේන්ද්‍රන අවදානම ලිහිල් කෙරී ඇත.

### R10 - ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම හො හිමිකම්පෑම් ගෙවීම්, ප්‍රතිරක්ෂණ ගෙවීම් සහ භාණ්ඩාගාරය වෙත අරමුදල් මාරුකිරීම් වැනි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට නොහැකියාව, Repos, නොයෙකුත් කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ණය කර වැනි විවිධ කල්පිරීම් සහිත ආයෝජන විවිධාංගකරණය කිරීම තුළින් අඩු කරගනු ලැබ ඇත.

### R11 -හිමිකම්පෑම් නිරවුල් කිරීමේ අවදානම

වංචනික, නෛතික හා තාක්ෂණික සාධක හේතුවෙන් පැන නැගිය හැකි ආරවුල් හිමිකම්පෑම් අනුමත කිරීමේදී දැඩි රෙගුලාසි පැනවීමට පියවර ගැනීම සහ හිමිකම්පෑම් සැකසුම් ක්‍රියාවලියේදී කාර්යයන් වෙන්කරලීම තුළින් පාලනය කෙරේ.

### අවදානම් ඇගැයුම් න්‍යාසය

මෙකී ප්‍රතිඵල පාදකකොටගෙන, පහත සඳහන් අවදානම් ඇගැයුම් න්‍යාසයෙහි දැක්වෙන අවදානම්

තීව්‍රතාව මත පිහිටා ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රමුඛ අවදානම් පිළිබඳ වාර ගණන

විශ්ලේෂණය ප්‍රමුඛතා සැලකිල්ලට ලක්කරනු ලැබ ඇත.

| | | වාර ගණන | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 |
| ප්‍රතිඵල | 1 | | | | R05 | R08 |
| | 2 | | | | R06 | |
| | 3 | R07 | R10 R02 | | | R11 |
| | 4 | R09 | | R04 | | |
| | 5 | R01 | R03 | | | |

# විගණන වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } ඊඑල්/අයි/5/2009
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2011 ජුනි ¹⁰ දින.

සභාපති,
ජාතික රක්ෂණ භාර අරමුදල

**ජාතික රක්ෂණ භාර අරමුදලේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාව 2011 මැයි 02 දින අරමුදලේ සභාපති වෙත නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. } 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

2

1:3 <u>විගණන විෂය පථය සහ මතය සඳහා පදනම</u>

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් විය. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

------------------

2.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජාතික රක්ෂණ භාර අරමුදල 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2009 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරඇති බවත් මා දරන්නා වූ මතය වේ.

3

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.**

2.2.1 **ගිණුම් ඉදිරිපත් කිරීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 4 වගන්තිය ප්‍රකාර ගිණුම් ඉදිරිපත් කළ යුත්තේ ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය නමින් වුවද ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇත්තේ ජාතික රක්ෂණ භාර අරමුදල නමින්ය.

(ආ)මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2009 වර්ෂය සඳහා ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2011 ජනවාරි 18 වන දිනදීය. ඒ අනුව මාස 11 ප්‍රමාදයක් දක්නට ලැබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් යටතේ දැක්විය යුතු රු.386,440 ක් වූ කාර්යාල උපකරණ මිලදී ගැනීම්, අළුත්වැඩියා වියදම යටතේ වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැරීම හේතුවෙන් කාර්යාල උපකරණ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.3 **නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම.**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම. |
| --- | --- |
| මු:රෙ 396 (ඩී) | නිකුත් කර මාස හයක් ඉක්මවූ රු.25,347,189 ක් වූ චෙක්පත් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| මු:රෙ 786 | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර රු.276,701 වටිනාකමින් යුත් ස්ථාවර වත්කම් අපහරණය කිරීම් වලට අදාල වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |

4.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

3.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.3,202,833,204ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,862,286,114ක් විය.

3.1.2 විග්‍රහාත්මක සමාලෝචනය

------------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව ප්‍රවර්තන වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල සාරාංශය පහත දැක්වේ.

| අයිතමය | ප්‍රවර්ථන වර්ෂය | පසුගිය වර්ෂය | පසුගිය වර්ෂය සමග සැසදීමේදී වාසිදායක (අවාසිදායක) ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| ශුද්ධ ආදායම | 3,323,605,303 | 2,917,401,041 | 13.92% |
| මුලු වියදම | 120,772.099 | 55,114,528 | (119) |
| ශුද්ධ අතිරික්තය | 3,202,833,204 | 2,862,286,114 | 11.9% |

3.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.2.1 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රතිරක්ෂණ සීමාව 2008 වර්ෂයේ සිට 1,000,000,000 ක් දක්වා වැඩි කර තිබූ අතර ත්‍රස්තවාදී ක්‍රියා පැවති කාලසීමාවේ පවා උපරිම වන්දි ගෙවීම් වටිනාකම වී ඇත්තේ රු.මිලියන 50.8 ක් වුවත් වර්තමානයේ ඉහල වටිනාකමට ප්‍රතිරක්ෂණය කිරීමට හේතුවූ පදනම විගණනයට හෙළිදරව් කර නොතිබුණි.

(ආ). 2007 වර්ෂයේ ගොඩනැගිලි කුළී පදනම මත ලබා ගැනීමේදී රාජකාරි කටයුතු වෙනුවෙන් භාවිතා නොකළ බිම් මහල සඳහා මාස 2 1/2 කට ආසන්න කාලයක් වෙනුවෙන් රු. 245,821ක් කුළී ගෙවා තිබුණි.

### 3.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **බදු ගිවිසුමේ 07 ජේදයේ ප්‍රකාර** 2007,2008,2009 යන වර්ෂවල අවස්ථා එකොළහකදී නවීකරණය කිරීම සඳහා දරන ලද රු.13,758,425 ක් අළුත්වැඩියා වියදම් ලෙස දක්වා තිබුණි. ගිවිසුම ප්‍රකාරව නවීකරණය සඳහා දරන ලද වියදම ස.තො.ස ආයතනයෙන් දැරිය යුතු නමුත් එම වියදම අරමුදලින් දරා ඇත. එම මුදල ස.තො.ස. ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ). බිම් මහල සඳහා 2007 වර්ෂයේ සිට මාසිකව රු. 88,808 ක් කුලී ලෙස ගෙවා තිබුණු අතර එය තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) අරමුදලේ පරිපාලනය
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඇ) ප්‍රතිරක්ෂණය
(ඉ) පරිගණක ගිණුම්කරණය
(ඊ) රක්ෂණ වන්දි
( උ) ආදායම් රැස් කිරීම

එච්.ඒ.එස්.සමරවීර
වැඩබලන විගණකාධිපති

# ආදායම් ප්‍රකාශය

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

*2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

| | සටහන් | 2009<br>අග්‍රහාර සහ වෙනත් | 2009<br>SRCC & Tr. | 2009<br>මුළු ගණන | 2008<br>මුළු ගණන |
|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | |
| ශුද්ධ ඉපැයුම් වාරික ආදායම | **01** | 1,784,327,414.43 | 2,235,158,805.80 | **4,019,486,220.23** | 3,427,950,662 |
| **ප්‍රතිලාභ පාඩු සහ වියදම්** | | | | | |
| රක්ෂණ හිමිකම්පෑම් සහ ප්‍රතිලාභ | **02** | (1,378,159,985.96) | (697,776,819.61) | **(2,075,936,805.57)** | (1,736,355,732) |
| | | 406,167,428.47 | 1,537,381,986.19 | **1,943,549,414.66** | 1,691,594,930 |
| **අනෙකුත් ආදායම** | | | | - | - |
| ආයෝජන ආදායම | | 140,551,227.14 | 1,223,907,847.03 | **1,364,459,074.17** | 1,205,463,441 |
| මෘදු ණය මත වූ පොලිය | | - | 15,125,027.42 | **15,125,027.42** | 19,424,829 |
| වෙනත් ආදායම | | 471,787.13 | - | **471,787.13** | 917,841 |
| | | 141,023,014.27 | 1,239,032,874.45 | **1,380,055,888.72** | 1,225,806,111 |
| **වියදම** | | | | - | - |
| කාර්ය මණ්ඩලයට අදාල වියදම් | **03** | 31,804,923.19 | 1,319,691.71 | **33,124,614.90** | 21,470,147 |
| පරිපාලන වියදම් | **04** | 44,419,579.86 | 4,826,801.25 | **49,246,381.11** | 28,264,346 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | **05** | 6,474,549.57 | 31,926,553.89 | **38,401,103.46** | 5,380,035 |
| **මුළු වියදම** | | 82,699,052.62 | 38,073,046.85 | **120,772,099.47** | 55,114,528 |
| **වියදම ඉක්ම වූ ආදායම** | | 464,491,390.12 | 2,738,341,813.79 | **3,202,833,203.91** | 2,862,286,514 |

# ශේෂ පත්‍රය

*2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා* *(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

| | සට හන | 2009 අග්‍රහාර හා වෙනත් | 2009 SRCC & Tr | 2009 මුළු ගණන | 2008 මුළු ගණන |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 06 | 29,625,193.96 | 13,978,310.47 | 43,603,504.43 | 44,659,780.96 |
| ආයෝජන | | 1162,413,507.08 | 7,387,793,213.58 | 8,550,206,720.66 | 7,749,178,615.97 |
| | | **1,192,038,701.04** | **7,401,771,524.05** | **8,593,810,225.09** | **7,793,838,396.93** |
| **ජංගම වත්කම්** | | | | | |
| ලැබිය යුතු අය | 07 | 332,368,396.89 | 1,747,202,021.82 | 2,079,570,418.71 | 1,988,501,988.46 |
| මුදල් සහ මුදල් සමකයන් | 08 | 85,101,390.32 | 25,071,612.23 | 110,173,002.55 | 239,795,257.72 |
| | | 417,469,787.21 | 1,772,273,634.05 | 2,189,743,421.26 | 2,228,297,246.18 |
| **මුළු වත්කම්** | | **1,609,508,488.25** | **9,174,045,158.10** | **10,783,553,646.35** | **10,022,135,643.11** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය සහ බැරකම්** | | | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | | | |
| සමුච්චිත අරමුදල | 09 | 1,422,321,413.25 | 7,942,531,369.40 | 9,364,852,782.65 | 8,412,019,580.13 |
| | | **1,422,321,413.25** | **7,942,531,369.40** | **9,364,852,782.65** | **8,412,019,580.13** |
| **තාක්ෂණික සංචිතය** | | | | | |
| නොඉපැයූ වාරික | 10 | - | 1,046,825,275.79 | 1,046,825,275.79 | 1,063,317,772.07 |
| විලම්බිත කොමිස් මුදල | 11 | - | (200,139,536.24) | (200,139,536.24) | (206,999,340.07) |
| | | - | **846,685,739.55** | **846,685,739.55** | **856,318,432.00** |
| **බැරකම්** | | | | | |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| ආණ්ඩුවේ පරිත්‍යාග | | 719,190.00 | - | 719,190.00 | 719,190.00 |
| ගෙවිය යුතු ලාභ කොමිස් මුදල් | 12 | - | 63,762,150.42 | 63,762,150.42 | 113,635,474.00 |
| | | **719,190.00** | **63,762,150.42** | **64,481,340.42** | **114,354,664.00** |
| **ජංගම බැරකම්** | | | | | |
| ගෙවිය යුතු හිමිකම්පෑම් | 13 | 157,481,448.00 | 172,018,472.88 | 329,499,920.88 | 333,321,632.00 |
| වෙනත් ගෙවිය යුතු දේ | 14 | 28,986,437.00 | 149,047,426.14 | 178,033,863.14 | 306,121,334.98 |
| | | **186,467,885.00** | **321,065,899.02** | **507,533,784.02** | **639,442,966.98** |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය සහ බැරකම්** | | **1,609,508,488.25** | **9,174,045,158.39** | **10,783,553,646.64** | **10,022,135,643.11** |

# සමුච්චිත අරමුදලේ වෙනස්කම් ප්‍රකාශය

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

*2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

| | 2009 අග්‍රහාර සහ වෙනත් | 2009 SRCC & Tr. | **2009 මුළු ගණන** | 2008 මුළු ගණන |
|---|---|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | | | |
| 2008-12-31 දිනට සමුච්චිත අරමුදල | 957,830,023.13 | 7,454,189,555.61 | 8,412,019,578.74 | 6,583,508,928 |
| පූර්ව වාර්ෂික ගැලපීම | | | | (33,775,862) |
| අඩු කළා (ඒකාබද්ධ අරමුදලට දායකත්වය | | (2,250,000,000.00) | (2,250,000,000.00) | (1,000,000,000) |
| වියදම ඉක්ම වූ ආදායම | 464,491,390.12 | 2,738,341,813.79 | 3,202,833,203.91 | 2,862,286,514 |
| 2009-12-31 දිනට සමුච්චිත අරමුදල | 1,422,321,413.25 | 7,942,531,369.40 | 9,364,852,782.65 | 8,412,019,580 |

# මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

*2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

| | 2009 | 2008 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇතිවූ මුදල් ප්‍රවාහ** | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය | **3,202,833,203.91** | 2,862,286,513.65 |
| අඩුකලා : ඒකාබද්ධ අරමුදලට කරනු ලැබූ සහ භාග | **(2,250,000,000.00)** | (1,000,000,000.00) |
| | **952,833,203.91** | 1,862,286,513.65 |
| **ගැලපීම් :** | | |
| ක්ෂයවීම් | **11,190,514.66** | 6,684,140 |
| ආයෝජන ආදායම් | **(1,364,459,074.17)** | (1,205,463,441) |
| නොඉපයූ රක්ෂණ වාරික ආදායම් | **(16,492,497.25)** | 185,622,046 |
| විලම්බිත කොමිස් | **6,859,804.31** | (45,682,112) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | **(410,068,048.54)** | 803,447,147 |
| අයවිය යුතු දෙයෙහි අඩුවීම් | **(91,068,430.25)** | 233,453,837 |
| ගෙවිය යුතු ලාභ කොමිස්වල වැඩිවීම් | **(49,873,323.58)** | 29,913,407 |
| පෙර වර්ෂය සඳහා වූ ගැලපීම් හේතුවෙන් ලාභයෙහි අඩුවීම් | **-** | (33,775,862) |
| ගෙවිය යුතු හිමිකම්වල අඩුවීම් | **(3,821,711.12)** | (269,501,000) |
| ගෙවිය යුතු වෙනත් දේවල වැඩිවීම් | **(128,031,264.84)** | 36,428,764 |
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රමාණ*** | **(682,862,778.33)** | 799,966,293 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිළදී ගැනීම් | **(10,190,446.22)** | (26,136,012) |
| ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආයෝජන | **(801,028,104.69)** | (2,299,835,376) |
| උපකරණ විකිණීම මගින් ලත් ලාභය | **-** | 77,789 |
| ආයෝජන ආදායම | **1,364,459,074.17** | 1,205,463,441 |
| **ආයෝජනය කිරීමේ ක්‍රියාකාරකම් සඳහා කළ ශුද්ධ මුදල් ප්‍රමාණ;** | **553,240,523.26** | (1,120,430,157) |
| **මුදල් සහ මුදල් සමකයන්හි ශුද්ධ වැඩිවීම්/අඩුවීම්** | **(129,622,255.07)** | (320,463,864) |
| කාල පරිච්ඡේදය ආරම්භයේ, මුදල් සහ මුදල් සමකයන් | **239,795,257.72** | 560,259,122 |
| කාලපරිච්ඡේදය අවසානයේ, මුදල් සහ මුදල් සමකයන් | **110,173,002.65** | 239,795,258 |
| ***මුදල් සහ මුදල් සමකයන්හි විශ්ලේෂණය*** | | |
| අතේ ඇති මුදල් සහ බැංකු ශේෂ | **93,999,851.87** | 230,795,258 |
| කෙටිකාලීන ආයෝජන | **16,173,150.68** | 9,000,000 |
| **මුදල් සහ මුදල් සමකයන්** | **110,173,002.55** | 239,795,258 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1.0 සමායතනික තොරතුරු

ජාතික රක්ෂණ භාර අරමුදල ("අරමදල") "2006 අංක. 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතින්" සංස්ථාගත කරන ලදුව, ශ්‍රී ලංකාව තුළ නිත්‍ය වශයෙන් පිහිටුවනු ලැබ ඇත. සමාගමේ ලේඛනගත කාර්යාලය කොළඹ 10, ඩී.ආර්.විජේවර්ධන මාවතේ අංක.70 දරන ස්ථානයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ද මෙකී ලිපිනයෙහි පිහිටා තිබේ.

මෙහෙයුම් වර්ෂය තුළ 2009 අගෝස්තු මාසයේදී අංක.1615/20 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් මෙම අරමුදල සිය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු පෞද්ගලික අංශයටද ව්‍යාප්ත කර ඇත.

## 2.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරනු ලැබූ සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබනුයේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

උද්ධමනකාරී සාධක වෙනුවෙන් ගැළපීම් කිසිවක් මේ ගිණුම්වලට ඇතුළත් කෙරී නොමැත.

අදාළ විටදී, ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල පැහැදිලි කරනු ලැබ ඇත.

## 2.2 තුලනාත්මක අගයන්

අරමුදල විසින් දිගටම අදාළ කෙරුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂයන්හි භාවිත කෙරුණු පිළිවෙත් වලට අනුකූල වේ. අවශ්‍ය තන්හි දී ඉකුත් වර්ෂයේ අගයන් යළි පෙළගස්වා මේ වර්ෂයේ ඉදිරිපත් කිරීමට ඇතුළත් කෙරී ඇත.

## 2.3 ප්‍රාග්ධන බැඳීම්

ශේෂ පත්‍රයෙහි දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොතිබිණි.

## 2.4 මුදල් ප්‍රවාහන ප්‍රකාශය

මුදල් ප්‍රවාහන ප්‍රකාශය පිළියෙළ කරනු ලැබ ඇත්තේ "අනියම් ක්‍රමවේදයක් " භාවිතයෙනි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති.....

## 2.5 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

ආශ්‍රිත පාර්ශව ගනුදෙනු කිසිවක් නොතිබිණි.

## 2.6 පශ්චාත් ශේෂ පත්‍ර කාර්යදාම

සියලුම පශ්චාත් ශේෂපත්‍ර කාර්යදාමයන් සැලකිල්ලට භාජනය කරන ලදුව අදාළ තන්හිදී මූල්‍ය ප්‍රකාශයන්හි ඒ ඒ සටහන්වල ගැළපීම් හෝ කරුණු අනාවරණය කිරීම් ඇතුළත් කරනු ලැබ තිබේ.

## 2.7 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම

### 2.7.1 දේපළ,පිරියත සහ උපකරණ

දේපළ,පිරියත සහ උපකරණ, ඒවායෙහි පිරිවැය අනුව සටහන් ගත කොට තිබේ.

දේපළ,පිරියත සහ උපකරණ යනු එකී වත්කම්, එහි අපේක්ෂිත පරිහරණය සඳහා ක්‍රියාකාරි තත්ත්වයන්ට පමුණුවාලීමේදී වැයවුණු කිසියම් වියහියදම් සමග ඒවායෙහි ගැනුම් මිල වෙයි.

අරමුදල පවත්වාගෙනයාම සඳහා තිර ස්වභාවයේ වත්කම් අත්කරගැනීම දිර්ඝ කරලීම හෝ වැඩිදියුණු කරලීම සඳහා වැය වූ වියහියදම්.

**ක්ෂයවීම්**

සියලුම දේපළ,පිරියත හා උපකරණවල ක්ෂයවීම් සඳහා වන ප්‍රතිපාදන ගණනය කෙරෙනුයේ ඒවායෙහි ගණන් බලා ඇති, ප්‍රයෝජනවත් ජීවිත කාලයට වැඩි ප්‍රමාණය පහත සඳහන් පරිදි සමාන වාර්ෂික කොටස් මුදල් වලින් කපාහරිනු පිණිස ඒවායෙහි වටිනාකම මත ඍජු රේඛා පදනම යොදා ගනිමිනි :-

| | | |
|---|---|---|
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | - | අවුරුදු 10 කට වැඩි |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | - | අවුරුදු 08 කට වැඩි |
| කාර්යාල උපකරණ | - | අවුරුදු 06 කට වැඩි |
| පරිගණක අවුරුදු | - | 05 කට වැඩි |
| මෝටර් වාහන | - | අවුරුදු 05 කට වැඩි |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති.....

**2.7.2 ආයෝජන**

පිරිවැය අනුව ආයෝජන දක්වා ඇත.

**2.7.2 ලැබිය යුතු දෑ**

වාරික පොළිය සහ අනෙකුත් ලැබිය යුතු දෑ එකතු කර ගැනීමට ඇති හැකියාව අඛණ්ඩව පවත්වාගෙනයාමේ පදනම මත සමාලෝචනය කරනු ලැබේ.

ණය ගැතියන් සහ එකතු කරගැනීමට අපහසු ලෙස හඳුනාගෙන ඇති අනෙකුත් ලැබිය යුතු දෑ කපාහරිනු ලැබේ.

**2.7.3 මුදල් හා මුදල් සමකයන්**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යය සඳහා මුදල් සහ මුදල් සමකයන් අතැති මුදල් සහ ශුද්ධ නොගෙවූ බැංකු අයිරා සම්බන්ධයෙන් වූ බැංකු තැන්පතුවලින් සංයුක්ත වේ.

**2.8 බැරකම් හා ප්‍රතිපාදන**

**2.8.1 නොඉපයූ වාරික**

නොඉපයූ වාරික යනු ශේෂ පත්‍රයෙහි දිනට පසුව යෙදුණු අවදානම් කාල පරිච්ඡේදයට අදාළ වන වර්ෂයක් තුළදී ලිඛිත වාරිකවල සමානුපාතයන් මේ නොඉපයූ වාරික දළ වාරිකයෙහි 24 වැනි පදනම මත ගණනය කෙරේ.

**2.8.2 විලම්බිත කොමිස් මුදල**

විලම්බිත කොමිස් මුදලෙන් පෙන්නුම් කෙරෙනුයේ නොඉපයූ වාරිකයට අදාළ ශුද්ධ කොමිස් මුදලය.

**2.8.3 ලාභ කොමිස් මුදල**

ලාභ කොමිස් මුදල ගණනය කොට වාරික දෙකකින් ගෙවනු ලැබේ. පළමු වාරිකය ගිණුම් කාල පරිච්ඡේදය අවසන්වී සය මසකින් සහ දෙවැනි වාරිකය ගිණුම් කාල පරිච්ඡේදය අවසන්වී දොළොස් මසකින් ගෙවනු ලැබේ.

**2.8.4 ගෙවීමට ඇති හිමිකම්පෑම්**

හිමිකම්පෑම් අදාළ මුදල් වර්ෂය තුළදී නොගෙවන අනුමත හිමිකම්පෑම්වලින්ද අරමුදලෙහි සාමාජිකයින් විසින් ප්‍රකාශයට පත් කෙරෙන ගෙවීමට ඉතිරිව ඇති හිමිකම්පෑම් සඳහා කෙරෙන ප්‍රතිපාදනවලින් සහ ප්‍රතිරක්ෂණය සහ ගොඩගැනුම් අයකරගැනීම් වෙතොත් ඒ සඳහා අදාළ වියදම් හා ඒ වෙනුවෙන් කෙරෙන ප්‍රතිපාදනවලින්ද සංයුක්ත වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති.....

**2.8.5 අනෙකුත් ගෙවිය යුතු දෑ**

අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායෙහි පිරිවැයෙහි දක්වා ඇත.

2.8.6 **වෙනත් ප්‍රතිපාදන**

ශේෂ පත්‍රයෙහි දිනට හඳුනාගත් සියලුම ප්‍රතිපාදන සඳහා ගිණුම්වල පූර්ණ වශයෙන් ඉඩ සලසා ඇත.

2.9 **ආදායම හා වියදම**

**2.9.1 ආදායම**

ආර්ථික ප්‍රතිලාභ, අරමුදල කරා ගලාඒමට ඉඩකඩ පැවැත්මේ සහ ආදායම විශ්වසනීය අයුරින් මුදාගත හැකිවීමේ ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙරාතුව මතු දැක්වෙන නිශ්චිත හඳුනා ගැනීමේ උපමාන ද සපුරාලීම අනිවාර්ය වෙයි.

**(අ) වාරික දායකත්වය**

වාරික දායකත්වය ඒවා ගෙවීම කළ යුතු කාලය එළඹීමේදී හඳුනාගනු ලැබේ.

**(ආ) පොලී ආදායම**

ඉදිරියේදී එකතුකරගැනීම් සැකසහිත වෙතොත් මිස පොලිය උපචිතවීමේදී පොලී ආදායම හඳුනාගනු ලැබේ.

**(ඇ). වෙනත්**

2.9.2 **වියදම් හඳුනාගැනීම**

අරමුදල පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙහි පවත්වාගෙන යාමේදී වැය වන සියලුම වියදම් ද අතිරික්තය ලබා ගැනීමේදී ආදායමට බැර කරනු ලැබ ඇත.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

*2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

| | 2009<br>අග්‍රහාර හා වෙනත් | 2009<br>SRCC & Tr. | 2009<br>මුළු ගණන | 2008 |
|---|---|---|---|---|
| **01. ඉපැයූ ශුද්ධ වාරික ආදායම** | | | | |
| සාමාජිකයන්ගේ සහභාග | 573,518,509.75 | - | **573,518,509.75** | 595,339,833 |
| භාණ්ඩාගාරයෙන් ලද සහභාග | 440,380,000.00 | - | **440,380,000.00** | 480,000,000 |
| වාරික ආදායම - මෝටර් | 244,352,904.71 | - | **244,352,904.71** | 130,018,979 |
| වාරික ආදායම - ප්‍රතිරක්ෂණය | 473,434,837.00 | - | **473,434,837.00** | 341,170,103 |
| වාරික ආදායම - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් | 15,408,459.53 | - | **15,408,459.53** | 30,000,000 |
| වාරික ආදායම - විදේශ සේවා නියුක්තිය | 200,483,864.00 | - | **200,483,864.00** | 118,428,753 |
| වාරික ආදායම - පොදු රක්ෂණය | 194,237.13 | - | **194,237.13** | |
| ලබන ලද දළ SRCC & Tr. වාරික | - | 2,420,345,103.68 | **2,420,345,103.68** | 2,317,492,759 |
| වාරික ආපසු ගෙවීම් | - | (5,956,996.54) | **(5,956,996.54)** | (4,604,167) |
| **දළ ලිඛිත වාරික** | 1,947,772,812.12 | 2,414,388,107.14 | **4,362,160,919.26** | 4,007,846,260 |
| ප්‍රතිරක්ෂණ වාරික | (163,445,397.69) | (195,721,798.59) | **(359,167,196.28)** | (394,273,552) |
| **ශුද්ධ ලිඛිත වාරික** | 1,784,327,414.43 | 2,218,666,308.55 | **4,002,993,722.98** | 3,613,572,708 |
| නොඉපයූ වාරික සඳහා සංචිතවල- | - | 16,492,497.25 | **16,492,497.25** | (185,622,046) |
| සිදුවූ ශුද්ධ වෙනස | 1,784,327,414.43 | 2,235,158,805.80 | **4,019,486,220.23** | 3,427,950,662 |
| **02. ප්‍රතිලාභ, පාඩු සහ වියදම්;** | | | | |
| උපැස් | 176,336,549.00 | - | **176,336,549.00** | 140,89,0949 |
| ආරෝග්‍ය ශාලා ගාස්තු | 449,089,973.00 | - | **449,089,973.00** | 122,404,018 |
| ප්‍රසව | 86,719,006.00 | - | **86,719,006.00** | 82,353,616 |
| හදිසි අනතුරු | 36,961,808.00 | - | **36,961,808.00** | 24,661,636 |
| වෛද්‍ය ගාස්තු | 13,832,025.37 | - | **13,832,025.37** | 261,629,904 |
| හෘද රෝග | 125,931,246.12 | - | **125,931,246.12** | 119,824,506 |
| පිළිකා | 18,590,588.00 | - | **18,590,588.00** | 21,946,633 |
| සාමාන්‍ය සහ හදිසි අනතුරු මරණ | 177,893,355.00 | - | **177,893,355.00** | 238,245,289 |
| මෝටර් හිමිකම් | 149,425,693.77 | - | **149,425,693.77** | 30,590,384 |
| විදේශ රැකියා හිමිකම් | 85,934,583.03 | - | **85,934,583.03** | 10,401,500 |
| ප්‍රතිරක්ෂණ හිමිකම් වියදම් | 46,326,266.42 | - | **46,326,266.42** | 24,854,739 |
| වෛද්‍ය රක්ෂණ පා.ම. | 11,112,229.00 | - | **11,112,229.00** | 19,268,220 |
| වෛද්‍ය රක්ෂණ හිමිකම්පෑම් - පොදු රක්ෂණය | 3,850.75 | | **3,850.75** | |
| උපචිත ශුද්ධ හිමිකම් SRCC & Tr | - | 348,788,492.66 | **348,788,492.66** | 79,182,967 |
| ශුද්ධ කොමිස් | 2,812.50 | 421,208,431.86 | **421,211,244.36** | 357,797,472 |
| ලාභ කොමිස් | - | (72,220,104.91) | **(72,220,104.91)** | 203,099,949 |
| | 1,378,159,985.96 | 697,776,819.61 | **2,075,936,805.57** | 1,736,355,732 |
| **03. කාර්ය මණ්ඩල පිරිවැය** | | | | |
| දළ වැටුප් | 25,753,225.10 | 1,196,656.64 | **26,949,881.74** | 17,043,399 |
| සේවක අර්ථසාධක-12% | 2,356,818.07 | 88,906.20 | **2,445,724.27** | 1,455,818 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල | 588,721.53 | 21,811.05 | **610,532.58** | 366,009 |
| අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 232,321.97 | 9,884.50 | **242,206.47** | 552,217 |
| වාර්ෂක ප්‍රසාද මුදල | 1,454,044.29 | - | **1,454,044.29** | |
| වෙනත් දීමනා | 437,395.79 | 2,433.32 | **439,829.11** | 1,121,219 |
| අනියම් වැටුප් | 982,396.44 | - | **982,396.44** | 931,485 |
| | 31,804,923.19 | 1,319,691.71 | **33,124,614.90** | 21,470,147 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්....

*2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

| | 2009 අග්‍රහාර හා වෙනත් | 2009 SRCC & Tr. | 2009 මුළු ගණන | 2008 |
|---|---|---|---|---|
| **04. පරිපාලන වියදම්** | | | | |
| ගමන් වියදම් | 47,319.00 | - | **47,319.00** | 283,730 |
| ක්ෂයවීම්; | 7,110,075.12 | 4,080,439.54 | **11,190,514.66** | 6,684,140 |
| කුලී | 3,067,399.09 | - | **3,067,399.09** | 2,480,254 |
| ජලය | 212,369.58 | - | **212,369.58** | 99,602 |
| විදුලිය | 3,263,237.50 | - | **3,263,237.50** | 1,263,958 |
| කාර්ය මණ්ඩල සුභසාධන වියදම් | 233,313.50 | | **233,313.50** | 606,228 |
| දුරකථන | 817,281.58 | 49,644.23 | **866,925.81** | 1,018,060 |
| මුද්‍රණය සහ ලිපිද්‍රව්‍ය | 3,660,601.59 | 11,310.30 | **3,671,911.89** | 3,962,902 |
| කාර්යාල නඩත්තුව | 14,348,620.83 | 12,232.83 | **14,360,853.66** | 4,948,607 |
| සහිපාරක්ෂක නඩත්තුව | - | - | **-** | 158,820 |
| පරීක්ෂා කිරීම් සහ තක්සේරු කිරීම් | 2,528,187.50 | 49,750.00 | **2,577,937.50** | 453,190 |
| දැයට කිරුළ වියහියදම් | 959,453.80 | - | **959,453.80** | - |
| පරිත්‍යාග | 2,535,000.00 | - | **2,535,000.00** | - |
| වෘත්තීය ගාස්තු | 55,552.00 | - | **55,552.00** | 205,750 |
| රැස්වීම් වියදම් | 90,377.79 | - | **90,377.79** | 111,925 |
| උපදේශක ගාස්තු | 453,880.00 | - | **453,880.00** | 1,832.970 |
| අන්තර්ජාල/විද්‍යුත් තැපැල් වියදම් | 548,021.00 | - | **548,021.00** | 448,500 |
| ඉන්ධන වියදම් | 168,732.00 | - | **168,732.00** | 108,990 |
| වාහන රක්ෂණ | 175,928.59 | 243,750.63 | **419,679.22** | 244,190 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 1,029,701.19 | - | **1,029,701.19** | 421,041 |
| පුවත්පත් සහ වාර සඟරා; | 19,789.90 | | **19,789.90** | 41,004 |
| නීති වියදම් | 10,550.00 | - | **10,500.00** | - |
| ආරක්ෂක ගාස්තු | 456,000.00 | - | **456,000.00** | 175,304 |
| තැපැල් | 2,507,095.00 | 51,450.00 | **2,558,545.00** | 2,463,618 |
| වාහන නඩත්තුව | 121,143.30 | 328,223.72 | **449,367.02** | 251,563 |
| | **44,419,579.86** | **4,826,801.25** | **49,246,381.11** | **28,264,346** |
| **05. මූල්‍ය සහ වෙනත් වියදම්** | | | | |
| බැංකු ගාස්තු | 599,292.87 | 435,702.38 | **1,034,995.25** | 204,746.27 |
| විගණක ගාස්තු | 13,000.00 | 108,008.50 | **121,008.50** | 414,922.00 |
| ජාතිය ගොඩනැගීමේ බදු වියදම් | - | 30,755,595.14 | **30,755,595.14** | 1,992,000.00 |
| මුද්දර ගාස්තු | 66,825.00 | - | **66,825.00** | - |
| බැහැර කිරීම් නිසා වූ පාඩු | - | 147,393.17 | **147,393.17** | 32,556.00 |
| තාක්ෂණ උපඃකමිටු පැමිණීමේ ගාස්තු | - | 205,500.00 | **205,500.00** | 199,500.00 |
| ක්‍රියාකාරී කමිටු පැමිණීමේ ගාස්තු | - | 123,750.00 | **123,750.00** | 155,250.00 |
| විනිමය පාඩුව | 3,403,748.18 | - | **3,403,748.18** | - |
| මඩුලුවල පැමිණීමේ ගාස්තු | - | 22,00.00 | **22,000.00** | - |
| විවිධ වියදම් | 282,530.02 | 9,804.70 | **292,334.72** | 493,771.20 |
| ප්‍රචාරක වියදම් | 2,109,153.50 | 118,800.00 | **2,227,953.50** | 1,1887,289.50 |
| | **6,474,549.57** | **31,926,553.89** | **38,401,103.46** | **5,380,035** |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්....

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

**සටහන 06: දේපළ, පිරියත සහ උපකරණ**

| | මෝටර් වාහන | කාර්යාල උපකරණ | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | මෘදුකාංග | විවිධ. වත්කම් | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| 2009/1/1 වන දිනට ශේෂය | 29,312,266 | 13,085,476 | 6,189,968 | 6,145,198 | 197,508 | **54,930,416** |
| එකතු කිරීම් | 300,750 | 8,770,477 | 997,345 | 121,875 | | **10,190,446** |
| බැහැරකිරීම් | - | (242,020) | (34,681) | - | (9,275) | **(285,976)** |
| 2009/12/31 වන දිනට ශේෂය | **29,613,016** | **21,613,933** | **7,152,631** | **6,267,073** | **188,233** | **64,834,886** |
| **ක්ෂයවීම්:** | | | | | | |
| 2009/01/01 වන දිනට ශේෂය | 4,444,618 | 2,540,384 | 1,252,019 | 1,886,651 | 46,503 | **10,170,175** |
| වර්ෂය සඳහා බැදීම් | 5,867,007 | 2,916,399 | 843,873 | 1,557,401 | 5,835 | **11,190,515** |
| වර්ෂය සඳහා බැහැර කිරීම්; | - | (112,717) | (16,591) | - | - | **(129,308)** |
| 2009/12/31 වන දිනට ශේෂය | 10,311,625 | 5,344,066 | 2,079,300 | 3,444,052 | 52,338 | **21,231,382** |
| | | | | | | - |
| 2009/12/31 වන දිනට අගය | **19,301,391** | **16,269,866** | **5,073,331** | **2,823,021** | **135,896** | **43,603,505** |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්....

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

| *2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා* | 2009 අග්‍රහාර හා වෙනත් | 2009 SRCC & Tr. | 2009 මුළු ගණන | 2008 |
|---|---|---|---|---|
| **07. අයවිය යුතු දේ** | | | | |
| BFE වලින් අයවිය යුතු වාරික | 16,397,700.00 | - | **16,397,700.00** | 14,553,053 |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දේ | 174,321,548.24 | - | **174,321,548.24** | 174,535,965 |
| වෙනත් අයවිය යුතු වාරික | 1,361,823.27 | 1,500.00 | **1,363,323.27** | - |
| අයවිය යුතු පොලී | 46,888,434.08 | 78,930,246.31 | **125,818,680.39** | 38,283,568 |
| SRRCC & Tr. වලින් අයවියයුතු වාරික | - | 388,014,979.26 | **388,014,979.26** | 381,344,808 |
| සකසුරුවම් සේවා ගාස්තු | 10,100,889.38 | - | **10,100,889.38** | 2,000,000 |
| අයවිය යුතු අත්තිකාරම් | 465,293.51 | - | **465,293.51** | 375,210 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික | 79,566,098.09 | - | **79,566,098.09** | - |
| මෘදු ණය | - | 1,273,523,895.66 | **1,273,523,895.66** | 1,374,977,411 |
| නැවත ගෙවිය යුතු තැන්පතු | 1,317,517.61 | - | **1,317,517.61** | 663,132 |
| කා්රය මණ්ඩල ණය මුදල් | - | 6,554,500.00 | **6,554,500.00** | - |
| පෙර ගෙවුම් රක්ෂණ | - | 176,900.59 | **176,900.59** | 174,776 |
| සාමාජිකයන්ගෙන් අයවිය යුතු චෙක්පත් ආපසු ගෙවුම් | 1,949,092.71 | - | **1,949,092.71** | 1,594,065 |
| | 332,368,396.89 | 1,747,202,021.82 | **2,079,570,418.71** | 1,988,501,988 |
| **08. මුදල් සහ මුදල් සමකයන්** | | | | |
| බැංකුවේ ඇති මුදල්; | 85,074,390.32 | 8,895,995.55 | **93,970,385.87** | 230,785,258 |
| අත ඇති මුදල් | 27,000.00 | 2,466.00 | **29,466.00** | 10,000 |
| කෙටිකාලීන ආයෝජන | - | 16,173,150.68 | **16,173,150.68** | 9,000,000 |
| | 85,101,390.32 | 25,071,612.23 | **110,173,002.55** | 239,795,258 |
| **09. සංචිත අරමුදල** | | | | |
| සංචිත අරමුදල | 957,830,023.13 | 7,454,189,555.61 | **8,412,019,578.74** | 6,583,508,928 |
| පූර්ව වර්ෂ ගැලපුම් | - | - | - | (33,775,862) |
| අඩුකළා : ඒකාබද්ධ අරමුදලට දෙන ලද සහභාග | | (2,250,000,000.00) | **(2,250,000,000.00)** | (1,000,000,000) |
| වීයදමට වඩා වැඩි ආදායම | 464,491,390.12 | 2,738,341,813.79 | **3,202,833,203.91** | 2,862,286,514 |
| | 1,422,321,413.25 | 7,942,531,369.40 | **9,364,852,782.65** | 8,412,019,580 |
| **10. නොඉපැයූ වාරික** | | | | |
| 2008/12/31 වන දිනට ශේෂය | - | 1,063,317,773.04 | **1,063,317,773** | 877,695,726 |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | - | (16,492,497.25) | **(16,492,497)** | 185,622,046 |
| 2009.12.31 දිනට ශේෂය | - | 1,046,825,275.79 | **1,046,825,276** | 1,063,317,772 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්....


| | | | | |
|---|---|---|---|---|
| **11. විලම්බිත කොමිස්** | | | | |
| 2008/12/31 වන දිනට ශේෂය | - | 206,999,340.55 | **206,999,341** | 161,317,228 |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | - | (6,859,804.31) | **(6,859,804)** | 45,682,112 |
| 2009/12/31 දිනට ශේෂය | - | 200,139,536.24 | **200,139,536** | 206,999,340 |
| **12. ගෙවිය යුතු ලාභ කොමිස්** | | | | |
| ගෙවිය යුතු ලාභ කොමිස් (2010 වර්ෂයේදී ගෙවිය යුතු වූ) | - | 63,762,150.42 | **63,762,150.42** | 113,635,474 |
| | - | 63,762,150.42 | **63,762,150.42** | 113,635,474 |
| **13. ගෙවිය යුතු හිමිකම්** | | | | |
| ගෙවිය යුතු හිමිකම් | 157,481,448.00 | 172,018,472.88 | **329,499,920.88** | 333,321,632 |
| | 157,481,448.00 | 172,018,472.88 | **329,499,920.88** | 333,321,632 |
| **14. වෙනත් ගෙවිය යුතු දේ** | | | | |
| උපචිත වියදම් | 1,851,912.13 | 80,347.99 | **1,932,260.12** | 9,728,074 |
| ගෙවිය යුතු වෙනත් | 16,666.25 | - | **16,666.25** | 9,335,232 |
| ගෙවිය යුතු SRCC & Tr වාරික | 5,848,227.68 | - | **5,848,227.68** | - |
| ගෙවිය යුතු මාර්ග ආරක්ෂණ බදු | 371,523.11 | - | **371,523.11** | 255,098 |
| ගෙවිය යුතු වාරික ආපසු ගෙවීම් | - | 13,093,388.88 | **13,093,388.88** | 180,869,259 |
| සුබසාධක සංගමයට ගෙවිය යුතු දායක මුදල් | 356,750.00 | - | **356,750.00** | - |
| හිමිකම් චෙක්පත්/ගෙවිය යුතු තුන්ඩු ආපසු ලැබුම් | 985,831.96 | - | **985,831.96** | 1,002,411 |
| ගෙවිය යුතු විගණක ගාස්තු | - | 225,000.00 | **225,000.00** | 1,146,000 |
| ගෙවිය යුතු වැට් බදු සහ ජා.ගො.බදු | 19,555,525.87 | 13,203,271.89 | **32,758,797.76** | 12,759,469 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | - | 122,445,417.38 | **122,445,417.38** | 91,025,791 |
| | 28,986,437.00 | 149,047,426.14 | **178,033,863.14** | 306,121,335 |


# මූල්‍ය සමාලෝචනය

## වාරික ආදායම

| | 2008 |
|---|---:|
| වැ.කැ.කෝ.සි.අ.භා තු. අ. | 2,317,492,759.00 |
| අග්‍රහාර - භාණ්ඩාගාර | 480,000,000.00 |
| අග්‍රහාර - සාමාජික | 595,339,833.06 |
| පාර්ලිමේන්තු මන්ත්‍රී | 30,000,000.00 |
| විදෙස් රැකියා | 118,428,752.50 |
| මෝටර් වාහන | 130,018,979.44 |
| ප්‍රතිරක්ෂණ | 341,170,102.84 |

| | 2009 |
|---|---:|
| වැ.කැ.කෝ.සි.අ.භා තු. අ. | 2,420,345,103.68 |
| අග්‍රහාර - භාණ්ඩාගාර | 440,380,000.00 |
| අග්‍රහාර - සාමාජික | 573,518,509.75 |
| පාර්ලිමේන්ත මන්ත්‍රී | 15,408,459.53 |
| විදෙස් රැකියා | 200,483,864.00 |
| මෝටර් වාහන | 244,352,904.71 |
| ප්‍රතිරක්ෂණ | 473,434,837.00 |
| පොදු රක්ෂණය | 194,237.13 |



# මූල්‍ය සමාලෝචනය...


2007 වර්ෂය තුළ දී ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලද්දේ රක්ෂණ යෝජනා දෙකක් (එනම්, අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සහ වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද රක්ෂණාවරණය) පමණක් වුවද, 2008 වර්ෂයේද ව්‍යාපාරික කටයුතු ව්‍යාප්තවීමත් සමග පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රක්ෂණ යෝජනා ක්‍රමය, මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රමය, ප්‍රතිරක්ෂණ සහ විදේශ රැකියා රක්ෂණ යෝජනා ක්‍රම ඇරඹිණි. මෙකී රක්ෂණ යෝජනා ක්‍රම තුළින් පිළිවෙලින් රුපියල් මිලියන 30 ක්, මිලියන 130, මිලියන 341 සහ මිලියන 118 ක් යනුවෙන් වාරික ආදායමක් වාර්තා ගත කෙර ඇත. වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල දීර්ඝකිරීම මගින් රුපියල් මිලියන 2,317 ක තරමක ඉහළ වාරික ආදායමක් වාර්තා ගත කළ අතර අග්‍රහාර රක්ෂණ යෝජනාක්‍රමය සමස්ථයක් වශයෙන් රුපියල් මිලියන 1,075 ක් වාර්තා ගත කර ඇත.

2009 වර්ෂය තුළදී අග්‍රහාර රක්ෂණ අංශය හැරුණුවිට අනිකුත් සියලුම රක්ෂණ කණ්ඩයන් මගින් වාරික උත්පාදනයෙහිලා සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලඝ අග්‍රහාර-භාණ්ඩාගාර, අග්‍රහාර-මන්ත්‍රීවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විදේශ රැකියා රක්ෂණය, මෝටර් වාහන රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය යටතේ පිළිවෙළින් රුපියල් මිලියන 2420 ක් (4.65% වැඩිවීමකි), රුපියල් මිලියන 440 ක් (8.25% ක අඩුවීමකි), රුපියල් මිලියන 573 ක් (3.65% අඩුවීමකි), රුපියල් මිලයන 15 ක් (50% ක අඩුවීමකි), රුපියල් මිලියන 200 ක් (69.29% ක වැඩිවීමකි), රුපියල් මිලියන 244 ක් (87.94 % ක වැඩිවීමකි), රුපියල් මිලියන 473 ක් (38.77% වැඩිවීමකි) වාර්තාගතවී ඇති අතර අභිනවයෙන් ස්ථාපිත සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ රුපියල් 194,000 වාරික ආදායමක් වාර්තා ගතවී තිබේ.

**දළ ලිඛිත වාරිකයෙහි උපනති විශ්ලේෂණය**

*(රුපියල් මිලියනවලින්)*


| | 2006 | 2007 | 2008 | 2009 |
|---|---|---|---|---|
| අග්‍රහාර හා වෙනත් | 318.90 | 925.34 | 1,694.96 | 1,947.77 |
| වැ.කැ.කෝ.සි.අ.හා ත්‍ර.අ. | - | 2,178.01 | 2,312.89 | 2,414.39 |





ඉකුත් සිව් වසර මුළුල්ලේ සමස්තයක් වශයෙන් දළ ලිඛිත වාරිකයෙහි උපනතිය විශ්ලේෂණයට භාජනය කිරීමේදී දළ ලිඛිත වාරිකයෙහි අඛණ්ඩ ඉහළයාමක් පෙන්නුම් කෙරේ.


# මූල්‍ය සමාලෝචනය...

**ශුද්ධ ලාභ විශ්ලේෂණය**




2008 සහ 2009 වර්ෂයන්හි ශුද්ධ ලාභ සංයුතිය විශ්ලේෂණය කිරීමේ දී වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලෙහි දායකත්වය 2008 වර්ෂයේ දී 84% සිට 2009 වර්ෂයේ 86% දක්වා වර්ධනය වී ඇති බව පෙන්නුම් කෙරේ.




ඉකුත් සිව් වසරක ශුද්ධ ලාභයෙහි උපනති විශ්ලේෂණය තුළින් නිරූපිතව ඇත්තේ ඉකුත් වසරේ වැඩිවීම තරමක් අඩු මට්ටමක වුවද අඛණ්ඩව ඉහළ යෑමත් සිදුව ඇති බව □කි.


# අග්‍රහාර රක්ෂණය පිළිබඳ සමාලෝචනය

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන රජයේ නිලධාරීන්ගේ යහසාධනය අරඹයා 1997 දී ස්ථාපිත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ආරම්භයේදී සහදායක රක්ෂණ යෝජනා ක්‍රමයක් ලෙස සිය මෙහෙයුම් කටයුතු අරඹා ඇත. එසේවුවද, 2004 වර්ෂයේදී රජය විසින් දෙවනුව එළැඹි තීරණයක් මත මෙකී යෝජනා ක්‍රමය වෙනුවෙන් රජයේ නිලධාරීන්ගේ මාසික වැටුපෙන් රුපියල් 75/- බැගින් අඩු කර ගන්නා ලදී. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණයට භාජනය කරනු ලැබූ අවස්ථාව වන තෙක්ම මෙම යෝජනා ක්‍රමය රකෂණ සංස්ථාව විසින් ක්‍රියාත්මක කෙරිණි. මේ සංස්ථාව පෞද්ගලිකරණය කරනු ලැබුවායින් අනතුරුව, 2006 ජනවාරි මස 01 වැනි දින සිට රජය විසින් මෙකී යෝජනා ක්‍රමය පවරාගන්නා ලදුව එය ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ වෙනමම රජයේ යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කෙරිණි.


තත් යෝජනා ක්‍රමය යටතේ පහත සඳහන් රක්ෂණ ප්‍රතිලාභ පිරිනැමිණි.

1. රෝහල් ගාස්තු වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිලාභ.
2. උපැස් මිලදී ගැනීම.
3. දරු උපත්.
4. ණය සුරැකුම් ණය යෝජනා ක්‍රමය.

අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවෙන් 2009 වර්ෂය සඳහා වන මාසික ලාභදායිත්ව විශ්ලේෂණය මතු දැක්වෙන පරිදි වේ.




අගහාර රක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවෙන් 2009 වර්ෂය සඳහා වන මාසික හිමිකම්පෑම් වාරික සහ ලාභ විශ්ලේෂණ මෙහි පනතින් දැක්වේ.




සමස්ත වාර්ෂික අග්‍රහාර සාමාජික දායකත්වය 2008 වර්ෂයේ රුපියල් මිලියන 595 සිට 2009 වර්ෂයේ රුපියල් මිලියන 573 දක්වා අඩුවී ඇත. මෙය 3.67% ක පහත වැටීමකි.

සමසත අග්‍රහාර භාණ්ඩාගාර දායකත්වය 2008 වර්ෂයේදී රුපියල් මිලියන 480 සිට 2009 වර්ෂයේ රුපියල් මිලියන 440 දක්වා අඩුවී තිබේ. මෙය 8.25% ක පහත වැටීමකි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වන මුළු වාර්ෂික දායකත්වය 2008 වර්ෂයේදී රුපියල් මිලියන 30 සිට 2009 වර්ෂයේදී රුපියල් මිලියන 15.4 දක්වා අඩුවී ඇත. මෙය 48.6% ක පහත වැටීමකි.

සමස්ත වාර්ෂික අග්‍රහාර හිමිකම්පෑම් වියදම 2008 වර්ෂයේ රුපියල් මිලියන 1,011 සිට 2009 වර්ෂයේදී මිලියන 1,085 දක්වා වැඩිවී තිබේ. මෙය 7% ක වෘද්ධියකි.

# මෝටර් වාහන රක්ෂණය පිළිබඳ සමාලෝචනය


ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටුවාලීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයන් සඳහා වාහන (අනිවාර්ය) සහ අර්ධ රාජ්‍ය ආයතන සඳහා වාහන (වෛකල්පික) රක්ෂණය කරලනු පිණිස මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වාදෙන ලදී.

ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) විසින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්ට දැරිය හැකි වාරික මත මෝටර් වාහන රක්ෂණය සලසනු ලැබේ. මේ ක්ෂේත්‍රය සීඝයෙන් වර්ධනය වන්නක් බවට ගණන් බලා ඇත. මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රමය දැනට පෞද්ගලික අවශ්‍යතා මෙන්ම පුද්ගලයින් සතු වාහනත් ඇතුළත් වන පරිදි දීර්ඝ කරනු ලැබ ඇත. රක්ෂණ භාර අරමුදල මගින් සපයනු ලබන මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රමය තුළින් කවර විටකදී වුවද එම වාහනයට මුහුණපෑමට සිදුවිය හැකි සියලුම දැනගන්නට ඇති උපද්‍රව වෙනුවෙන් රක්ෂණාවරණ සලසාලමින් වාහන හිමිකරුවන්ට මානසික සහනයක් සලසා දෙනු ලැබේ. හිමිකම්පෑම් ගෙවීම් ක්‍රියාවලිය පහසුකරලනු පිණිස ඉහළ මට්ටමේ ප්‍රවීණත්වයෙන් යුත් කක්සේරුකරුවන් කණ්ඩායමක් දිවයින පුරා සේවයෙහි යොදවනු ලැබ ඇති අතර හිමිකම්පෑම් ඉදිරිපත් කරනු ලැබූවිටදී අදාළ පරීක්ෂණ පැවැත්වීමට ඔවුන් විසින් වහාම පියවර ගනු ලැබේ.


ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සලසනු ලබන මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ලබාගත හැකි අතිරේක රක්ෂණ ආවරණ වනුයේ ජලගැලීම්, තෙවැනි පාර්ශව දේපළ හානි, පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ, හීරුබදු රහිත නැවිගත කිරීම්, වාරිකව ගෙවීමට භාණ්ඩ මිළට ගැනීම, වාමලු රක්ෂණාවරණය, ඇදගෙනයාමේ ගාස්තු, වාහන ඉදිරිපස වීදුරු රක්ෂණ ආවරණය, ආධුනික රියදුරු රක්ෂණ ආවරණය, රියදුරු/ ක්ලීනර්/ සහායකයන් සේවක වන්දි, මගීන් වෙනුවෙන්

නෛතික වගකීම, පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ, ජීඅයිටි ආදිය වේ.

මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවෙන් 2009 වර්ෂය සඳහා වන මාසික ලාභදායිත්ව විශ්ලේෂණය මතු දැක්වේ.




මෝටර් වාහන රකෂණ යෝජනා ක්‍රමය යටතේ 2009 වර්ෂය සඳහා වන මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දැක්වෙන පරිදි වේ:




සමස්ත වාර්ෂික මෝටර් වාහන වාරික ආදායම 2008 වර්ෂයේදී රුපියල් මිලියන 130 සිට 2009 වර්ෂයේදී රුපියල් මිලියන 244 දක්වා වැඩිවී ඇත. මෙය 87.94% ක වර්ධනයකි.

සමස්ත වාර්ෂික මෝටර් වාහන හිමිකම්පෑම් වියදම් 2008 වර්ෂයේදී මිලියන 30.6 සිට 2009 වර්ෂයේදී රුපියල් මිලියන 149.4 දක්වා වැඩිවී ඇත. මෙය 388.47% දක්වා වැඩිවීමකි.


# ප්‍රතිරක්ෂණය පිළිබඳ සමාලෝචනය

දේශීය සාමාන්‍ය රක්ෂණ වෙළෙඳ පලෙන් අනිවාර්ය ප්‍රතිරක්ෂණ කොටස ප්‍රතිග්‍රහණය කිරීමට 2007 නොවැම්බර් මස 19 වැනි දිනැති අංක 1528/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික රක්ෂණ භාර අරමුදලට (NITF) බලය පවරන ලදී. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික ගනුදෙනුවල නියැලෙන එක් එක් රක්ෂණ සමාගමක සාමාන්‍ය රක්ෂණ වැඩසටහනෙන් (නිශ්චිතව සඳහන් කරනු ලබන විධිවිධානයන්ට යටත්ව) අනිවාර්ය ප්‍රතිරක්ෂණ කොටස ලෙස 20% ක ප්‍රතිශතයක් රක්ෂණ භාර අරමුදල නියම කොට දක්වා ඇත. 2009 අගෝස්තු මස 20 වැනි දින අංක 1615/20 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සෘජු සාමාන්‍ය රක්ෂණ ගනුදෙනුවල නියැලීමට ද ජාතික රක්ෂණ භාර අරමුදලට බලය පැවරී ඇත.


ඉහතකී දින සිට ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයන්හි නියැලිය හැකි බලයලත් එකම ආයතනය ජාතික රක්ෂණ භාර අරමුදල වෙයි. 2008 ජනවාරි මස 01 වැනි දින සිට සියලුම දේශීය රක්ෂණ සමාගම්වල 20% ක අනිවාර්ය ප්‍රතිරක්ෂණ කොටස ප්‍රතිග්‍රහණය කර ගනිමින් ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයෙහි නියැලී සිටී. මෙලෙසින් ක්‍රියාකරමින් විදේශ විනිමයෙන් විශාල කොටසක් රට තුළ රඳවා ගැනීමට අරමුදල සමත් විය. දේශීය ප්‍රතිරක්ෂණකරු ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල, 20% ක ප්‍රතිරක්ෂණ වැඩසටහන, රථවාහන රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණය සඳහා වන ලෝකයේ විශාලතම ප්‍රතිරක්ෂණ තැරැව්කරුවන් වන AON Benfield Re යන සමාගම යොදා ගනිමින් ලොව ඉහළ ප්‍රසිද්ධියක් උසුලන බොහෝ ප්‍රතිරක්ෂණකරුවන් සමග එක්ව තම අවදානම් නිරාවරණය කොටගෙන තිබේ. මේ අතර, වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලට අදාළ තැරැව්කාරිත්වය Willis Re යන සමාගමට පවරා ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අවදානම් භාරදීමේ වැඩපිළිවෙල GIC සහ Best Re යන ප්‍රතිරක්ෂණ සමාගමේ ප්‍රධානත්වයෙන් සිදුවේ. සාමාන්‍ය රක්ෂණය සහ මෝටර් වාහන රක්ෂණයෙහි ලා ප්‍රධානත්වය උසුලනුයේ ද GIC සහ Best Re යන සමාගම් වේ. වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල ARK Syndicate යන ව්‍යාපාරික හවුලේ ප්‍රධානත්වයෙන් සිදුවේ.

ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවෙන් 2009 වර්ෂය සඳහා කෙරුණු මාසික ලාභදායිත්ව විශ්ලේෂණය පහත දැක්වේ.




ප්‍රතිරක්ෂණ යෝජනාක්‍රමය වෙනුවෙන් 2009 වර්ෂය සඳහා කෙරුණු මාසික හිමිකම්පෑම්, වාරිකය, ලාභ විශ්ලේෂණය මෙහි පහතින් දැක්වේ.




සමස්ත වාර්ෂික ප්‍රතිරක්ෂණ වාරික ආදායම 2008 වර්ෂයේ දී රුපියල් මිලියන 341 සිට 2009 වර්ෂයේ දී රුපියල් මිලියන 473 දක්වා වැඩිවී ඇත. මෙය 38.77% ක වර්ධනයකි.

සමස්ත වාර්ෂික ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් වියදම් 2008 වර්ෂයේදී රුපියල් මිලියන 24.8 සිට 2009 වර්ෂයේදී රුපියල් මිලියන 46.3 දක්වා වැඩිවී ඇත. මෙය 86.39% ක වර්ධනයකි.

# වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල පිළිබඳ සමාලෝචනය

අමාත්‍ය මණ්ඩලය විසින් එළඹි තීරණයක් ප්‍රකාර 1987 වර්ෂයේදී වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල ස්ථාපිත කෙරිණි.

ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී රක්ෂණ සංවිධානයන් වන්නාවූ අරමුදලේ සියලුම සාමාජිකයින් විසින් නිකුත් කෙරුණු , ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමාවන් ඇතුළත වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදුවන දේපළ අලාභ හානි, පුද්ගල, මරණ/ශාරීරික තුවාල ආවරණය වන පරිදි රක්ෂණ ඔප්පු මත අතිරේක රක්ෂණාවරණ සලසාලීම එමගින් අරමුණු කෙරිණි. 1987 වර්ෂයේ සිට මෙම අරමුදල පරිපාලනය කරන ලද්දේ ජාතික රක්ෂණ සංස්ථාව විසිනි. 2005.08.01 වන දින සිට ජනශක්ති රක්ෂණ සමාගමෙන් පවරාගනු ලැබ මෙකී යෝජනා ක්‍රමය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පරිපාලනය කරන්නට යෙදුණි. අනතුරුව, ජාතික රක්ෂණ භාර අරමුදල පනතෙහි 18(ඇ) වගන්තිය යටතේ වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල 2007 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදලට අන්තර්ග්‍රහණය කෙරිණි. ශ්‍රී ලංකාව තුළ ජීවිත රක්ෂණයට අයත් නොවන රක්ෂණ ඔප්පු ප්‍රාරක්ෂණය කරන්නාවූ සියලුම රක්ෂණ සමාගම් වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා තස්තවාද අරමුදලෙහි සාමාජිකත්වය ලැබීම අනිවාර්ය ය.

වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් මතු දැක්වෙන පරිදි වේ:-

- රක්ෂණ සමාගම හරහා වාරිකය එකතු කර අරමුදලට ප්‍රේෂණය කරලීම.
- කයාකාරී කමිටුවේ නිර්දේශය මත රක්ෂණ සමාගම් විසින් හිමිකම්පෑම් ගෙවීම් සහ වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල මගින් ප්‍රතිපූර්ණය කරලීම.
- මහත් ව්‍යසනකාරී සිද්ධීන් හේතුකොටගෙන සිදුවිය හැකි හිමිකම්පෑම් පිරිවැය ඉහළ යාම ලිහිල් කරලනු පිණිස විස්වස්‍ය ණය ප්‍රමාණයන් හිමි විදේශ ප්‍රතිරක්ෂණ කරුවන් සමග අලාභ ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙළක් දියත් කිරීම.
- ත්‍රස්ත ප්‍රහාරයන් හේතුකොටගෙන අලාභහානි වූ ආයතනයනට ලංකා බැංකුව විසින් පරිපාලනය කරනු ලැබූ මෘදු ණය දීම් කළමනාකරණය කරලීම.


වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලෙහි අරමුණු මතු දැක්වෙන පරිදි වේ:-

- ❖ අරමුදල මගින් ආවරණය කෙරුණු වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදය පිළිබඳ අවදානම ඇතුළත් වන පරිදි දීර්ඝ කෙරුණු රක්ෂණ ඔප්පු හේතුකොටගන 4 වන වගන්තියෙහි අර්ථ නිරූපිත පරිදි අරමුදලෙහි සියලුම සාමාජිකයින් හට ලැබෙන රක්ෂණ වාරිකයන්හි වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද සහභාගය තුළින් එම අරමුදල පිහිටුවාලීම.
- ❖ භූගෝලීය සීමාව දීර්ඝ කරීමක් සඳහා විධිවිධාන සැලසෙන්නාවූ වර්ගයේ


සාමාන්‍ය රක්ෂණ අවදානම ඇතුලුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි භූගෝලීය සීමාවන් ඇතුළත රක්ෂණාවරණය සහිතව පිහිටා ඇති අවදානම් සම්බන්ධ රක්ෂණ ඔප්පුවෙහි අර්ථ නිරූපිත පරිදි වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන දේපළ අලාභ/හානි හෝ පුද්ගලයින්ට තුවාල සිදුවීම සම්බන්ධයෙන් ආරක්ෂාව සලසාලීම.

❖ අරමුදලටත් ශ්‍රී ලංකා ආණ්ඩුවටත් නිරාවරණයවීම අවම කරගැනීමේ අරමුණින් වාසිදායක මට්ටමකින් ප්‍රතිරක්ෂණය තුළින් අරමුදල ආරක්ෂා කර ගැනීම.

වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල සඳහා 2009 වර්ෂයේ මාසික ලාභදායිත්ව විශ්ලේෂණය මතු දැක්වෙන පරිදි වේ.




වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල සඳහා 2009 වර්ෂය වෙනුවෙන් වූ මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දැක්වේ.




සමස්ත වාර්ෂික වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලේ වාරික ආදායම 2008 වර්ෂයේදී රුපියල් මිලියන 2,317 සිට 2009 වර්ෂයේදී රුපියල් මිලියන 2420 දක්වා වැඩිවී ඇත. මෙය වූ කලී 4.44 % ක වර්ධනයකි.

පිය වනු ලැබූ සමස්ත වාර්ෂික වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදලෙහි ශුද්ධ හිමිකම්පෑම් 2008 වර්ෂයේදී රුපියල් මිලියන 79 සිට 2009 වර්ෂයේදී රුපියල් මිලියන 349 දක්වා වැඩිවී තිබේ. මෙය 341.7% ඉහළ යෑමකි.

# සාමාන්‍ය රක්ෂණය පිළිබඳ විශ්ලේෂණය

2009.08.20 වැනි දින නිකුත් කෙරුණ අංක. 16/5/20 දරන ගැසට් නිවේදනය ප්‍රකාර මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ පිහිටුවන ලදී.


ජාතික රක්ෂණ භාර අරමුදල මුහුදු නැව් භාණ්ඩ, ගුවන් භාණ්ඩ වෙනුවෙන් උවදුරු රක්ෂණ යෝජනා ක්‍රම සම්පාදනය කර ඇති අතර එමගින් මුහුදින්, ගොඩබිමෙන්, මුහුදෙහි,ගුවනෙහි හෝ ගොඩබිමෙහි හෝ දේශීය වශයෙන් සිය මාර්ගස්ථ (අනියම් වශයෙන් ගබඩා කර තබාගැනීම ඇතුලුව) භාණ්ඩවලට සිදුවන අලාභහානි හෝ ඒවා විනාශවීම් සම්බන්ධයෙන් රක්ෂිතයා හානිපූරණය කරනු ලැබේ.

මුහුදු උවදුරු (නැව්බඳ) රක්ෂණ ඔප්පුවෙන්, යාත්‍රා, කෙටි මුහුදු යාත්‍රා, වරාය හා ගංගා යාත්‍රා, සියලුම මාදිලියේ පෞද්ගලික විනෝද චාරිකා හා වානිජ ප්‍රවාහන ගුවන්යානා හා පෞද්ගලික ග්ලයිඩර් යානා, හෙලිකොප්ටර් යානා,බිම් උපකරණ සහ වෙනත් යාත්‍රා වෙනුවෙන් රක්ෂණ ආවරණය සලසනු ලැබේ. මෙය යානයට, යානයේ බඳට සහ එහි යන්ත්‍රෝපකරණවලට සිදුවන භෞතික/ අලාභහනි සම්බන්ධයෙන් නැව්හිමියාට ආරක්ෂාව සලසනු ලබන සර්ව අවදානම් රක්ෂණාවරණයකි.


ජාතික රක්ෂණ භාර අරමුදලේ ගින උවදුරු රක්ෂණ ඔප්පුවෙන්, ගෘහස්ථ බොයිලේරු සහ ගෑස් ස්ථාපනයන් පිපිරීම් ඇතුලු ගිනි හා විදුලි උවදුරු වලින් සිදුවන අලාභහානි සම්බන්ධයෙන් රක්ෂාණාවරණය සපයනු ලැබේ. මෙය, පිපිරීම්, හිතාමතා හානි සිදුකිරීම්, සංඝට්ටන හානි, ගුවන් යානා හානි, පුපුරායෑම්, ජලටැංකි උපකරණ හෝ නළ පිටාර ගැලීම මෙන්ම ජලගැලීම්, භූකම්පන, ගිනිකඳු පිපිරීම්, සැඩ කුණාටුව, නවර්තන සුළි සුළඟ (ටයිෆනය) චණ්ඩ මාරුතය, ගිගිරුම් සහිත කුණාටුව, ප්‍රචණ්ඩ සුළි සුළඟ, සුනාමිය සහ උදම් රළ වැනි අතිරේක උවදුරු ආවරණය කරනු පිණිස දීර්ඝ කරනු ලැබිය හැකිය. තවද, එය වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද සහ හිතාමතා අලාභහානි සිදුකිරීම් වෙනුවෙන් ආවරණය සැලසෙන පරිදි දීර්ඝ කළ හැකිය.

මෙම විවිධ පන්ති රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පුද්ගල හදිසි අනතුරු රක්ෂණය, සැත්කම් හා සෞඛ්‍ය රක්ෂණය, මුදල් රක්ෂණය, ගමන් භාණ්ඩ රක්ෂණය, ගෙවල් බිඳුම් රක්ෂණය, සේවක වන්දි රක්ෂණය, වෙළහෙළදාම් ස්ථාන රක්ෂණය, මහජන වගකීම් සහ සෙසු විවිධ පංති රක්ෂණය වෙනුවෙන් ආවරණය සලසනු ලැබේ.


ගිනි උවදුරු රක්ෂණ ක්‍රමය සඳහා 2009 වර්ෂයේදී මාසික ලාභදායිත්ව විශ්ලේෂණය මතු දැක්වෙන පරිදි වේ.




මුහුදු උවදුරු රක්ෂණ ක්‍රමය සඳහා 2009 වර්ෂයේදී මාසික ලාභදායිත්ව විශ්ලේෂණය මතු දැක්වෙන පරිදි වේ.





2009 වර්ෂයේ ගිනි උවදුරු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දැක්වේ.





2009 වර්ෂයේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දැක්වේ.




2009 වර්ෂයේ මුහුදු උවදුරු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දැක්වේ.



2009 වර්ෂයේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දැක්වේ.





2009 වර්ෂයේ සමස්ත වාර්ෂික සාමාන්‍ය රක්ෂණ වාරික ආදායම රුපියල් 194,237 කි. 2009 වර්ෂයේ සමස්ත වාර්ෂික සාමාන්‍ය රක්ෂණ හිමිකම් වියදම් රුපියල් 3,850 ක් වේ.


# විදේශ රැකියා රක්ෂණය පිළිබඳ සමාලෝචනය

ජාතික රක්ෂණ භාර අරමුදල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් සමග එළඹි ගිවිසුම ප්‍රකාර 2008 ජුනි මාසයේදී මෙම විදේශ රැකියා රක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කෙරිණි. ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් රක්ෂණාවරණය ලැබ විදෙස් රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යන 18-65 අතර වයස් කාණ්ඩයෙහි ශ්‍රී ලාංකකයන්ට මෙමගින් රක්ෂණාවරණය සැලසේ. වසර දෙකක කොන්ත්‍රාත්තුවක් සඳහා රු.800+වැට් සහ වසර තුනක කොන්ත්‍රාත්තුවක් සඳහා රු.850+වැට් වාරිකයක් අය කෙරේ.

විදේශ රැකියා රක්ෂණ ක්‍රමය සඳහා 2009 වර්ෂය වෙනුවෙන් වන මාසික ලාභදායිත්ව විශ්ලේෂණය පහත සඳහන් පරිදි වෙයි:-




විදේශ සේවා නියුක්ති රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා 2009 වර්ෂය වෙනුවෙන් වන මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභදායිත්ව විශ්ලේෂණය මතු දැක්වේ:-




මෙම විදේශ රැකියා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රතිලාභ අත්කරගත හැකිය:-

විදෙස්හි රැකියාවේ නියැළී සිටියදී කිසියම් හේතුවක් නිසා මෙරටට ආපසු එවීම සහ මියයාම ශ්‍රී ලංකාවට විත් තෙමසක් ඇතුළත මියයාම, කොන්ත්‍රාත්තු කාල පරිච්ඡේදය ඇතුළත දී අසාධ්‍ය රෝගයන්ට හෝ හදිසි අනතුරකට ගොදුරුවීමේ හේතුවෙන් මියයාම, කොන්ත්‍රාත්තු කාල පරිච්ඡේදය තුළදී, සේවයෙහි නියැලී සිටියදී ශාරීරික දුබලතාවකට පත්වීම, කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය තුළදී රැකියාවෙහි යෙදී සිටියදී අර්ධ වශයෙන් සදහටම ශාරීරික දුබලතාවකට පත්වීම, පවුලේ සාමාජිකයින් වෙනුවෙන් රක්ෂණාවරණය, කොන්ත්‍රාත්තු කාල පරිච්ඡේදය ඇතුළත විදෙස්හි රැකියාවේ යෙදී සිටියදී මුළුමනින්ම තාවකාලිකව ශාරීරික දුබලතාවයකට පත්වීම.

කොන්ත්‍රාත්තු කාල පරිච්ඡේදය තුළදී අර්ධ වශයෙන් තාවකාලිකව ශාරීරික දුබලතාවකට පත්වීම. පිළිකාව, අම්ලපිත්ත රෝගය (Gastritis) සහ මදුමේහය (Diabetic) ආදිය වෙනුවෙන් විශේෂ රක්ෂණාවරණය ලබාගත හැකිය.

සමස්ත වාර්ෂික විදේශ රැකියා රක්ෂණ වාරික ආදායම, 2008 වර්ෂයේදී රුපියල් මිලියන 118.4

සිට 2009 වර්ෂයේ රුපියල් මිලියන 200.5 දක්වා වැඩිවී ඇත. මෙය 69.29% ක වර්ධනයකි.

සමස්ත වාර්ෂික විදේශ සේවා නියුක්ති රක්ෂණ හිමිකම්පෑම් වියදම්, 2008 වර්ෂයේදී රුපියල් මිලියන 10.4 සිට 2009 වර්ෂයේ රුපියල් මිලියන 85.9 දක්වා වැඩිවී ඇත. මෙය 726.17% ක ඉහළ යාමකි.

# සිව් වසරක සාරාංශය

## ආදායම සහ වියදම පිළිබඳ ප්‍රකාශය

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

| | 2009<br>මුළු ගණන | 2008<br>මුළු ගණන | 2007<br>මුළු ගණන | 2006<br>මුළු ගණන |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| ඉපැයූ ශුද්ධ වාරික ආදායම; | 4,019,486,220 | 3,427,950,662 | 2,654,902,681 | 318,902,642 |
| **ප්‍රතිලාභ පාඩු සහ වියදම්** | | | | |
| රක්ෂණ හිමිකම් සහ ප්‍රතිලාභ | (2,075,936,806) | (1,736,355,732) | (1,423,044,038) | (242,465,993) |
| | 1,943,549,415 | 1,691,594,930 | 1,231,858,643 | 76,436,649 |
| **වෙනත් ආදායම්** | | | | |
| ආයෝජන ආදායම; | 1,364,459,074 | 1,205,463,441 | 528,264,787 | |
| මැදු ණය මත පොලී | 15,125,027 | 19,424,829 | 38,713,576 | |
| වෙනත් ආදායම; | 471,787 | 917,841 | | |
| | 1,380,055,889 | 1,225,806,111 | 1,798,837,006 | 76,436,649 |
| **වියදම්** | - | - | | |
| කාර්ය මණ්ඩලය ආශ්‍රිත පිරිවැය | 33,124,615 | 21,470,147 | 11,500,953 | 1,333,806 |
| පරිපාලන වියදම් | 49,246,381 | 28,264,346 | 14,142,950 | 1,508,940 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 38,401,103 | 5,380,035 | 3,385,205 | 138,170 |
| **මුළු වියදම්** | 120,772,099 | 55,114,528 | 29,029,109 | 2,980,916 |
| **වීයදමට වරෙහිව ආදායම** | **3,202,833,204** | **2,862,286,514** | **1,769,807,897** | **73,455,733** |

# සිව් වසරක සාරාංශය...

## ශේෂ පත්‍රය

*(සියලුම අගයයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)*

*2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

| | 2009<br>මුළු ගණන | 2008<br>මුළු ගණන | 2007<br>මුළු ගණන | 2006<br>මුළු ගණන |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 43,603,504 | 44,659,781 | 25,240,465 | 1,461,388 |
| ආයෝජන | 8,550,206,721 | 7,749,178,616 | 5,449,343,240 | - |
| | 8,593,810,225 | 7,793,838,397 | 5,474,583,705 | 1,461,388 |
| **ජංගම වත්කම්** | | | | |
| අයවිය යුතු දේ | 2,079,570,419 | 1,988,501,988 | 2,221,955,826 | 511,844,970 |
| මුදල් සහ මුදල් සමකයන් | 110,173,003 | 239,795,258 | 560,259,122 | 13,357,202 |
| | 2,189,743,421 | 2,228,297,246 | 2,782,214,948 | 525,202,172 |
| **මුළු වත්කම්** | 10,783,553,646 | 10,022,135,643 | 8,256,798,653 | 526,663,560 |
| **සාමාන්‍ය කොටස් සහ බැරකම්** | | | | |
| සාමාන්‍ය කොටස් | | | | |
| සමුච්චිත අරමුදල | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| සංචිත ප්‍රාග්ධනය | - | - | | |
| | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| **තාක්ෂණික සංචිත** | | | | |
| නොඉපැයූ වාරික | 1,046,825,276 | 1,063,317,772 | 877,695,727 | |
| විලම්බි; fldÕia | (200,139,536) | (206,999,340) | (161,317,228) | |
| | 846,685,740 | 856,318,432 | 716,378,499 | |
| **බැරකම්** | | | | |
| ජංගම නොවූ බැරකම් | | | | |
| රාජ්‍ය ප්‍රදාන | 719,190 | 719,190 | 719,190 | 719,190 |
| ගෙවිය යුතු ලාභ කොමිස් | 63,762,150 | 113,635,474 | 83,722,067 | |
| grant | 64,481,340 | 114,354,664 | 84,441,257 | 719,190 |
| **ජංගම බැරකම්** | | | | |
| අයිරා | | | | |
| වර්ෂයක් තුළ ගෙවිය යුතු ණය; | | | | |
| ගෙවිය යුතු හිමිකම් | 329,499,921 | 333,321,632 | 602,777,397 | - |
| ගෙවිය යුතු වෙනත් | 178,033,863 | 306,121,335 | 269,692,571 | 431,842,361 |
| | 507,533,784 | 639,442,967 | 872,469,968 | 431,842,361 |
| මුළු අගය සහ බැරකම් | 10,783,553,646 | 10,022,135,643 | 8,256,798,653 | 526,663,560 |

# සමායතනික තොරතුරු

❖ **ආයතනයේ නම :-**

ජාතික රක්ෂණ භාර අරමුදල

❖ **නෛතික ආකෘතිය :-**

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි.

❖ **ලේඛනගත කාර්යාලය :-**

ජාතික රක්ෂණ භාර අරමුදල

අංක. 70, ඩි.ආර්. විජේවර්ධන මාවත

කොළඹ - 10.

❖ **විගණකවරු:-**

බාහිර විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

අභ්‍යන්තර අභ්‍යන්තර විගණනය කරනුයේ අභ්‍යන්තර විගණන කාර්යාංශය විසිනි.

❖ **බැංකුකරුවෝ:-**

මහජන **බැංකුව**, ලංකා **බැංකුව** සහ ජාතික **ඉතිරිකිරීමේ බැංකුව**.